සැ.යු.– මෙම ගැසට් පත්‍රයෙහි දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් වෙනවෙනම පළ වේ.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1942/21- 2015 නොවැම්බර් මස 26 වැනි බ්‍රහස්පතින්දා - 2015.11.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනත

### 4 (2) වගන්තිය යටතේ කරනු ලබන පළකිරීම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (මෙහි මින් මතු "ආයතන" යනුවෙන් සඳහන් කරනු ලබන) වෙත පැවරී ඇති බලතල අනුව මූල්‍ය වාර්තාකරණ අරමුණ සඳහා දේපළ පිරියත සහ උපකරණ ආයෝජන දේපළ සහ ජීව විද්‍යාත්මක වත්කම් අගය කිරීම මත උපදේශ සම්මතකර 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිත පණතේ අරමුණු සඳහා මේ සමග පල කරමි. මූල්‍ය වාර්තාකරණ අරමුණ සඳහා දේපළ පිරියත සහ උපකරණ ආයෝජන දේපළ සහ ජීව විද්‍යාත්මක වත්කම් අගය කිරීම මත උපදේශ 2015 ඔක්තෝබර් මස පළමුවන දිනෙන් ආරම්භවන කාලපරිච්ඡේද ආවරණය කෙරෙන මූල්‍ය ප්‍රකාශන සඳහා බලාත්මක වේ.

ආයතනයේ පාලක සභාවේ අණ පරිදි,

අරුණ අල්විස්,
ලේකම්.

2015 නොවැම්බර් මස 26 වැනි දින,
කොළඹ 07,
මලලසේකර මාවත,
අංක 30 ඒ,
ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ දීය.

**මූල්‍ය වාර්තාකරණ අරමුණු සඳහා දේපළ පිරියත සහ උපකරණ ආයෝජන දේපළ සහ ජීව විද්‍යාත්මක වත්කම් අගය කිරීම මත උපදේශ**

**වියාචනය**

මූල්‍ය වාර්තාකරණය අරමුණු කරගෙන, දේපළ, පිරියත හා උපකරණ, ආයෝජන දේපළ සහ ජීව විද්‍යාත්මක වත්කම්වල සාධාරණ වටිනාකම් පිළිබඳ නිගමනවලට එළඹීම සඳහා, වාර්තා පිළියෙල කරන්නන්, පරිචයේ යෙදී සිටින්නන් සහ තක්සේරුකරුවන්හට මාර්ගෝපදේශ සැළසීම මෙම ලියවිල්ලේ අරමුණය. මෙම මාර්ගෝපදේශයන්හි ඇතුළත් නිර්දේශයක් හා අදාළ කිසියම් නීතියක හෝ රෙගුලාසියක හෝ ගිණුම්කරණ ප්‍රමිතයක හෝ අවශ්‍යතාවයන් අතර ගැටුමක් ඇතිවිට, මෙහි පසුව සඳහන් කළ අවශ්‍යතාවන් පෙරටුවීම සිදුවිය යුතු ය. මෙම මාර්ගෝපදේශයන්හි ඇතුළත්/ අත්හැරුණු නියමයන් කෙරෙහි විශ්වාසය තැබීම තුළින් හෝ වෙනත් ලෙසකින්, ඒවායේ ප්‍රතිඵල ලෙස යම් පාර්ශවයකට සිදුවන කිසිවක් හෝ ප්‍රතිවිපාකයක් වෙනුවෙන් (පැහැර හැරීම හෝ වෙනත් දෑ ඇතුළුව) මොනම වගකීමක් හෝ බැඳීමක් කිසිම ලෙසකින්වත් භාර ගැනීමට ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට නොහැකිය.

පටුන

1. හැඳින්වීම
2. ව්‍යවහාරකරණය
3. සුදුසුකම්
4. ඇල්මේ ගැටුම
5. තක්සේරු වාර්තාව බලාත්මක දිනය
6. අගය කිරීමේ පදනම
7. කාර්යයේ විෂය පථය
8. වාර්තාවේ අන්තර්ගතය
9. මූල්‍ය වර්තාකරණ අරමුණු සඳහා සාධාරණ අගය එළඹීමේදී **SLFRS 13**න් වන උපදේශ
    i. සමස්ථ විග්‍රහය
    ii. සාධාරණ අගය මත ආකෘතිමය රාමුව
    iii. වත්කම් හෝ වගකීම්
    iv. ප්‍රධාන හෝ වඩාත් වාසිදායක වෙළෙඳපොළ
    v. මූල්‍ය නොවන වත්කම් සඳහා ඉහළම සහ හොඳම භාවිතය
    vi. වෙළෙඳපොළ සහභාගි වන්නන්ගේ ගති ලක්ෂණ
    vii. තක්සේරු කිරීමේ ශිල්ප ක්‍රම
    viii.තක්සේරු කිරීමේ ශිල්පක්‍රමවලට යෙදවුම්
    ix. නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් භාවිත කරන තක්සේරු හෝ කිරීමේ ශිල්පක්‍රම ක්‍රමාංකනය කිරීම
10. සංරචකකරණය/ කොටස් කරණය සහ ක්ෂය කිරීම
11. වත්කම් හුවමාරුව
12. වත්කම් හානිකරණය
13. මූල්‍ය වාර්තාකරණ අරමුණු සඳහා වත්කම් අගය කිරීම මත තක්සේරු විශේෂඥයන් සමග වැඩ කිරීම
14. මූල්‍ය වාර්තාකරණ අරමුණ සඳහා තක්සේරුකරුවකුගේ වැඩ භාවිත කිරීම මත විගණකයනට උපදේශන.

1. **හැඳින්වීම**

මූල්‍ය වාර්තාකරණ අරමුණ සඳහා අගය කිරීම් පුළුල් ලෙස භාවිත කෙරේ. ඒ මෙම උපදේශයේ අරමුණ වන්නේ මූල්‍ය වාර්තාකරණයේ අභිප්‍රාය සඳහා ආකෘතිමය රාමුවක් ලබා දෙමින් **දේපළ, පිරියත සහ උපකරණ** (PPE) **ආයෝජන දේපළ** (IP) **සහ ජීව විද්‍යාත්මක වත්කම්** (BA) අගය කිරීමේ දී විශ්වසනීයත්වයක් සංගතභාවයක් සහතික කිරීම ය. මෙම උපදේශය පිළියෙල කිරීමේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (SLFRSs) සහ අන්තර්ජාතික තක්සේරු කිරීමේ ප්‍රමිත (IVS) වලට අවශ්‍යතාවයන් සහ අනුමිතිය සැළකිල්ලට ගෙන ඇත. මෙය ඉදිරිපත් කර ඇත්තේ මූල්‍ය වාර්තා කරණ අරමුණ සඳහා සංගත ව්‍යවහාරකරණයක් එකඟ වීමට හැකිවීම පිණිස එවැනි වත්කම්වල පැතිකඩවල් පැහැදිලි කරදීමට ය.

2. **ව්‍යවහාරකරණය**

මෙම ව්‍යවහාරකරණ උපදේශ අදාළ වන්නේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත යටතේ එවැනි වත්කම්වල අගය නිශ්චිතව දැන ගැනීමේ අරමුණු සඳහාය. මූල්‍ය ප්‍රකාශනවල අගය ඇතුළත් කිරීමේ වගකීම භාරගත් අය අදාළ ගිණුම්කරණ ප්‍රමිතයකින් පැහැදිලිව වෙනස්කර ඇත්නම් හැර අදාළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සහ පොදු තක්සේරු කිරීමේ ප්‍රමිතවල අඩංගු මූලධර්ම සපුරාලීම අවශ්‍ය කෙරේ.

3. **සුදුසුකම්**

පොදු ගිණුම් කටයුතුභාවය ඇති අස්තිත්ත්වවල මූල්‍ය වාර්තාකරණ අරමුණ සඳහා දේපළ පිරියත උපකරණ (දේපිඋ), ආයෝජන දේපළ (ආදේ) සහ ජීව විද්‍යාත්මකකම් (ජීව) බාහිර අගය කිරීමක වගකීම භාරගත යුත්තේ මෙහි පහත සඳහන් පරිදි, එක්කෝ අ, ආ හෝ ඇ හි සුදුසුකම් ලැබීමේ නිර්නායකය සපුරාලන සුදුසුකම්ලත් තක්සේරුකරුවන් විසින්ය.

අ. පහත සඳහන්වන දෑ සහිත ශ්‍රී ලංකා තක්සේරුකරුවන් ගේ ආයතනයේ (IVSL) සංස්ථාපිත සාමාජිකයෙක්

- **i.** අධි සාමාජිකයකු හෝ
- **ii.** එවැනි ශ්‍රේණියක සාමාජිකත්වයේ වසර 5 ක පළපුරුද්ද සහිත උපාධිධාරී සාමාජිකයෙක්
- **iii.** එවැනි ශ්‍රේණියක සාමාජිකත්වයේ වසර 20 ක පළපුරුද්ද සහිත ආශ්‍රිත සාමාජිකයෙක්

ආ. පහත සඳහන් වන දෑ සහිත එක්සත් රාජධානියේ වරලත් මිනින්දෝරුවන්ගේ රාජකීය ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙක් (වමිරාආ)

- **i.** අධි සාමාජිකයෙක්
- **ii.** එවැනි ශ්‍රේණියේ සාමාජිකත්වයේ වසර 5 ක පළපුරුද්දක් ඇති වමිරාආ යේ සාමාජිකයෙක්

ඇ. තාක්ෂණික හා විද්‍යාත්මක හෝ අන් වශයෙන් සුවිශේෂී ස්වභාවයේ වත්කම් සඳහා තක්සේරුකරු විශේෂ උපදෙස් අවශ්‍යයයි සිතන්නේ නම් ඔහු ප්‍රවීණයෙකුගේ උපදෙස් පැතිය යුතුය.

4. **ඇල්මේ ගැටුම**

මූල්‍ය වාර්තාකරණ අරමුණු සඳහා, දේපිඋ, ආදේ සහ ජීව අගය කිරීම හා සම්බන්ධවන වෘත්තිකයන් ආචාර ධර්ම අවශ්‍යතා සමඟ අනුකූලව කටයුතු කිරීම අවශ්‍ය කෙරේ. (උදා: ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ආචාර ධර්ම සංග්‍රහය) එබැවින් වෘත්තිකයකු ඇල්මේ ගැටුමක් ලෙස පෙනී සිටිය හැකි තත්ත්වයන් හඳුනා ගැනීමට සාධාරණ පියවරවල් ගත යුතුය. යම් තර්ජන වේ නම් තර්ජනවල වැදගත්කම ඇගයීම මත, අවශ්‍යකරණ විටදී එම තර්ජන ඉවත් කිරීමට හෝ පිළිගතහැකි මට්ටමක් කරා අඩු කිරීමට ගත යුතු ආරක්ෂක පියවර වෘත්තිකයෙක් ව්‍යවහාර කළ යුතුය. එමෙන්ම සේවාදායකයා සමඟ සම්බන්ධතාවය හෝ නිශ්චිත කාර්යභාරයක නියැලීම, භාරගැනීමට පෙර හෝ අඛණ්ඩව පවත්වාගෙන යෑමේදී ව්‍යාපාරික ඇල්ම හෝ සේවාදායකයා සමඟ හෝ තුන්වන පාර්ශවයක් මගින් ඇතිකරන ලද යම් තර්ජන වල වැදගත්කම වෘත්තිකයා ඇගයිය යුතුය.

පොදු ගිණුම් කටයුතුභාවය ඇති අස්තිත්ත්වයන්හි එවැනි සෑම වත්කම්/ බාහිර අගය කිරීමේ වගකීම භාරගත යුත්තේ සම්බන්ධිත පාර්ශව (LKAS 24 සම්බන්ධිත පාර්ශව හෙළි කිරීමෙහි 9 වන ඡේදයේ නිර්වචනය කර ඇති පරිදි) විෂය පථය තුළ නොවන තක්සේරුකරුවන් විසින්ය.

5. **තක්සේරු කිරීමේ වාර්තා බලාත්මක දිනය**

තක්සේරු වාර්තාවේ අගය කිරීමේ බලාත්මක දිනය සඳහන් කළ යුතු අතර එවැනි අගයක් එම දිනයේ සිට මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගත යුතුය.

6. **අගය කිරීමේ පදනම**

මූල්‍ය වාර්තාකරණය සඳහා අගය කිරීමේ පදනම වනුයේ SLFRS 13 *සාධාරණ අගය මැනීමෙහි* නියමකර ඇති **සාධාරණ අගයයි.**

7. **කාර්යයේ විෂය පථය**

අගය කිරීමේ අරමුණ පිළිබඳ විස්තරයක්, විමර්ශනය කිරීමේ ප්‍රමාණය, තෝරාගත් ක්‍රියාපටිපාටි, උපකල්පන සහ සීමා කිරීමේ වාර්තාවේ ඇතුළු කිරීමට අස්තිත්ත්වය සහතික විය යුතුය.

8. **වාර්තාවේ අන්තර්ගතය**

තක්සේරු වාර්තාවක ඇතුළත් විය යුතු අයිතමයන්ගේ ලැයිස්තුවක් 01 වන ඇමුණුමේ නියම කර ඇත.


9. **මූල්‍ය වාර්තාකරණ අරමුණ සඳහා සාධාරණ අගය එළඹීමේදී SLFRS 13 න් වන උපදේශ**

**i. සමස්ථ විග්‍රහය**


ප්‍රධාන වෙළඳපොළකදී (හෝ ප්‍රධාන වෙළඳපොළක් නොමැතිවිටකදී වඩාත් වාසිදායක වෙළඳපොලකදී) ප්‍රවර්තන වෙළඳපොළ තත්ත්වයන් යටතේ මිනුම්කරණ දින වෙළඳපොළ සහභාගී වන්නන් අතරේ (මිනුම්කරණ දින වත්කම දරාසිටින වෙළඳපොළ සහභාගීවන්නන්ගේ පැත්තෙන් ගත්කළ ඉවත් වීමේ මිල) සිදුවන වත්කම විකිණීමට සිදුවන විධිමත් ගණුදෙනුවකදී එවැනි අයිතම සාධාරණ අගයට මැනීමට වන මිළ ඇස්තමේන්තු කිරීමේ අරමුණ මත පදනම් මත සාධාරණ අගය වෙනත් SLFRSs මගින් අවශ්‍ය කරන්නේ නම් හෝ අවසර දෙන්නේ නම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත SLFRS 13 මූලික සහ පසුව යන මැනීම් දෙකටම ව්‍යවහාර කළ හැකි සාධාරණ අගය මැනීමේ ආකෘතිමය රාමුවක් සළසා ඇත.

උදා:-

- LKAS 16 දේපළ පිරියත සහ උපකරණහි ප්‍රත්‍යාගණන ආකෘතිය ප්‍රකාරව පසුව මනිනු ලබන ස්ථාවර වත්කම් මැනීමේ සහ හෙළිදරව් කිරීම යන භාෂිත දෙකම අනුව SLFRS 13 විෂය පථය තුළ වේ.
- LKAS 40 ආයෝජන දේපළ යටතේ සාධාරණ අගය ආකෘතිය හෝ පිරිවැය ආකෘතිය ප්‍රකාරව එය මැන ඇත්දැයි යන්න නොසළකා මැන ඇති ආයෝජන දේපළ පිරිවැය ආකෘතිය අනුගමනය කර ඇතිවිටක පවා LKAS 40 හි 79 (ඊ) ඡේදයෙන් සාධාරණ අගය හෙළිදරව් කිරීම අවශ්‍ය කරන නිසා, (එබැවින් මැනීම අවශ්‍ය කරන) ආයෝජන දේපළ SLFRS 13 හි විෂය පථය තුළ වේ.



**ii. සාධාරණ අගය මැනීම මත ආකෘතිමය රාමුව**



**iii. වත්කම් හෝ වගකීම්**

සාධාරණ අගය මැනීම විශේෂ වත්කමක් හෝ වගකීමක් සඳහාය. එබැවින් සාධාරණ අගය මනින විට, මනිනු ලබන දිනයේ වත්කම හෝ වගකීම මිල කිරීමේදී වෙළෙඳපොළ සහභාගීවන්නන් යම් ගතිලක්ෂණයක් සැළකිල්ලට ගන්නේ නම් අස්තිත්ත්වය එම ගතිලක්ෂණ සාධාරණ අගය මැනීමේදී ගණන් ගත යුතුය. උදාහරණ වශයෙන් එම ගතිලක්ෂණවලට පහත දෑ ඇතුළත් යඃ

(අ) වත්කමේ තත්ත්වය සහ පිහිටි ස්ථානය

(ආ) විකිණීම හෝ භාවිතය සඳහා යම් සීමා කිරීමක් වේනම් එය වත්කම භාවිතය මත ඇති සීමාවන්ට යටත් කිරීම, *උදාහරණයක්.* ඉඩමක් දානපතියකු වෙනත් ආකාරයකින් සංවර්ධනය වූ පදිංචියට සුදුසු ප්‍රදේශයක පිහිටීම ඉඩම ක්‍රීඩා පිටියක් ලෙස යොදා ගැනීමට ලාභ සඳහා නොවන අසල්වාසී ක්‍රීඩා සංගමයකට පැහැදිලි ලෙස සඳහන් කරමින් දායකත්වය දරයි. ඉඩම දැනට ක්‍රීඩා භූමියක් ලෙස ප්‍රයෝජනයට ගනී. ඉඩම ප්‍රයෝජනයට ගැනීම පිළිබඳව පරිත්‍යාග කරන්නාගේ සීමා කිරීම සංගමයට පමණක් සීමා කර ඇති බව පැහැදිලිව සඳහන් කර ඇති බව අදාළ ලිපි ලේඛන සමාලෝචනය මත බව සහ සංගමය ඉඩම් විකුණුවහොත් සීමා කිරීම වෙළෙඳපොළ සහභාගී වන්නන්හට නොපැවරෙන බවද සංගමය නීර්ණය කරයි. එපමණක්ද නොව සංගමය ඉඩම විකිණීමද සීමා කර නැත. සංගමය ඉඩම ප්‍රයෝජනය කිරීමට ඇති සීමා කිරීම හැර ඉඩම නේවාසික අරමුණ සඳහා සංවර්ධනය කිරීමට බිමක් ලෙස ප්‍රයෝජනයට ගත හැකිය. මෙයට අමතරව ඉඩම මං අයිතියට යටත් ඉඩමකි. (එනම් ඉඩම හරහා විදුලි රැහැන් ඇදීමට හැකි පොදු ප්‍රයෝජනය සඳහා හැකියාව ලබාදෙන නෛතික අයිතියක්)

එබැවින් සීමාකිරීම සහ මං අයිතිය නිසා පැන නගින ඉඩමේ සාධාරණ අගය මැනීමට වන බලපෑම පහත වේ.

(i) ඉඩම ප්‍රයෝජනයට ගැනීම මත පරිත්‍යාග කරන්නාගේ සීමා කිරීම. මෙම අවස්ථාවේදී පරිත්‍යාග කරන්නාගේ ඉඩම ප්‍රයෝජනයට ගැනීමේ සීමා කිරීම සංගමයට පමණක් විශේෂිත නිසා, මෙම සීමා කිරීම වෙළෙඳපොළ සහභාගීවන්නන්හට පැවරිය නොහැක. එම නිසා සංගමයට ඉඩම ප්‍රයෝජනයට ගැනීමට ඇති සීමාකිරීම සැලකිල්ලට නොගෙන ඉඩම ක්‍රීඩා පිටියක් ලෙස ප්‍රයෝජනයට ගැනීමේදී වන සාධාරණ අගයට වඩා (එනම්ඃ වෙළඳපොළ සහභාගී වන්නන් වෙනත් වත්කම් හෝ වගකීම්වල සංයෝජනයන් ඉඩම ප්‍රයෝජනයට ගෙන එමගින් වත්කමේ සාධාරණ වටිනාකම උපරිම කරනු ලැබේ.) නේවාසික අරමුණ සඳහා සංවර්ධනය කිරීමට බිමක් ලෙස ඉඩම ප්‍රයෝජනයට ගැනීමේදී වැඩි සාධාරණ අගයක් එයට ලබාගත හැකිය. (එනම් වෙළෙඳපොළ සහභාගීවන්නන්ට එය තනි තනි පදනම මත ප්‍රයෝජනයට ගැනීම මගින් වත්කමේ සාධාරණ අගය උපරිම කරගත හැකිය.)

(ii) පොදු ප්‍රයෝජනය සඳහා රැහැන් ඇදීමේ මං අයිතිය පොදු ප්‍රයෝජනය සඳහා විදුලි රැහැන් ඇදීමේ අයිතිය (එනම් ගතිලක්ෂණයක්) ඉඩමට විශේෂිත නිසා ඉඩම සමඟ එය වෙළඳපොළ සහභාගිවන්නන් හට පැවරේ. ඉඩමේ ඉහළම හෝ හොඳම ප්‍රයෝජනයට ගැනීම එය ක්‍රීඩා පිටියක් ලෙස හෝ නේවාසික අරමුණ සඳහා සංවර්ධනය කිරීමට බිමක් ලෙස යොදා ගැනීමද යන්න නොසළකා ඉඩමේ සාධාරණ අගය මැනීමේදී මං අයිතියේ බලපෑම ගණන් ගත යුතු වේ.

**iv. ප්‍රධාන හෝ වඩාත් වාසිදායක වෙළෙඳපොළ**

එක්කෝ,

- ප්‍රධාන වෙළඳපොළේ හෝ,
- වඩාත් වාසිදායක වෙළඳපොළේ (ප්‍රධාන වෙළඳපොළක් නොපවතින විට) සිදුවන ගණුදෙනුවකදී වත්කමක් විකිණීමෙන් ලැබෙන මිල සාධාරණ අගයයි. ප්‍රධාන (හෝ වඩාත් වාසිදායක) වෙළඳපොළ තහවුරු කිරීමට හැකිවනු වස් අස්තිත්ත්වයක් හව්‍ය වෙළඳපොළවල් ඇගයීම අවශ්‍ය වේ. ප්‍රධාන (හෝ වඩාත් වාසිදායක) වෙළඳපොළ සොයා ගැනීමට අස්තිත්ත්වයක් සවිස්තරාකාර ගවේෂණයක් භාර ගැනීම අවශ්‍ය නොකෙරේ. එසේ වුවත් තිබෙන සියලුම තොරතුරු සැළකිල්ලට ගත යුතුය. එයට පටහැනි තොරතුරු නොමැති වන විටකදී අස්තිත්ත්වය සාමාන්‍යයෙන් අයිතම සඳහා ගණුදෙනුකරන වෙළඳපොළ ප්‍රධාන වෙළඳ පොළ (හෝ වඩාත් වාසිදායක) ලෙස උපකල්පනය කෙරේ. අස්තිත්ත්වයක් ප්‍රධාන වෙළඳපොළ හඳුනාගත් පසු වඩාත් වාසිදායක වෙනත් වෙළඳපොළක් (පොළවල්) පැවතියේ වූයේ වුවද, සාධාරණ අගය මැනිය යත්තේ ප්‍රධාන වෙළඳපොළේදීය. මෙයට අමතරව මිනුම්කරණ දින හව්‍ය වෙළඳපොළට ප්‍රවේශ විය හැකි විය යුතුය.

උදා: වෙනස් ක්‍රියාකාරී වෙළඳපොළවල් දෙකක වෙනස් මිලට වත්කමක් විකිණීම

| **වෙළඳපොළ** | **A** | **B** |
|---|---|---|
| වාර්ෂික පරිමාව | 30,000 | 20,000 |
| මාසික විකුණුම් සංඛ්‍යාව | 30 | 12 |
| ලැබුණ මිල | 2,600 | 2,500 |
| ගණුදෙනු පිරිවැය | 300 | 100 |
| ප්‍රවාහන පිරිවැය | 200 | 200 |
| ලැබූ ශුද්ධ වටිනාකම | 2,100<br>(2600 - 300 - 200) | 2,200<br>(2500 - 100 - 200) |
| වෙළඳපොළ තත්ත්වය | ප්‍රධාන වෙළඳපොළ (විශාල පරිමාවක් සහ ක්‍රියාකාරී මට්ටමක් ඇති වෙළඳපොළ) | වඩාත් වාසිදායක වෙළඳපොළ (ප්‍රවේශ වීමට වෙළඳපොළ/ තොරතුරු ලබා ගත නොහැකි නම්) |
| විය හැකි සාධාරණ අගය | 2,400<br>(2600 - 200) | 2,300<br>(2500 - 200) |

**v. මූල්‍ය නොවන වත්කම් සඳහා ඉහළම සහ හොඳම භාවිතය**

වත්කමක් එහි ඉහළම සහ හොඳම භාවිත කිරීම මගින් ආර්ථික ප්‍රතිලාභ උත්පාදනය කිරීමට වෙළඳපොළ සහභාගීවන්නකුගේ හැකියාව හෝ වත්කම භාවිත කිරීමෙන් පහත වන දෑ ගණන් ගැනීමෙන් පසු එය වෙනත් වෙළඳපොළ සහභාගීවන්නකුට විකිණීමෙන් වත්කම භාවිත කිරීමෙන් එහි ***ඉහළම සහ හොඳම අගය*** මූල්‍ය නොවන වත්කමක සාධාරණ අගය මැනීමේදී ගණන් ගැනේ.


(අ) භෞතිකව විය හැකි - වත්කම මිල කිරීමේදී වෙළඳපොළ සහභාගී වන්නන් ගණන් ගන්නා වත්කමේ භෞතික ගති ලක්ෂණ (එනම් පිහිටීම හෝ දේපොළ ප්‍රමාණය)

(ආ) නෛතිකව අවසර දිය හැකි - වත්කම මිල කිරීමේදී වෙළඳපොළ සහභාගීවන්නන් ගණන් ගන්නා වත්කම භාවිතයමත වන නෛතික සීමා කිරීම් (උදා. දේපළකට අදාළ විය හැකි කලාපකරන සීමා කිරීම්)

(ඇ) මූල්‍ය ශක්‍යතාවය - භෞතිකව විය හැකි සහ නෛතිකව අවසර දිය හැකි වත්කමක්, එම භාවිතය සඳහා යෙදවූ වත්කමේ ආයෝජනයට වෙළඳපොළ සහභාගිවන්නන්ට අවශ්‍ය කරන ප්‍රතිලාභය නිෂ්පාදනය කිරීමට ප්‍රමාණවත් ආදායම් හෝ මුදල් ප්‍රවාහ (එම භාවිතය සඳහා වත්කම පරිවර්තනය කිරීමට වූ පිරිවැය ගණන් ගැනීමෙන්) ජනනය වන්නේ දැයි සලකා බැලිය යුතුය.

අස්තිත්ත්වය වෙනස් භාවිතයක් අපේක්ෂාකරන්නේ වුයේ වුවද ඉහළම සහ හොඳම භාවිතය නීර්ණය කරන්නේ **වෙළඳපොළ සහභාගී වන්නන්ගේ සාපේක්ෂ වැදගත්කම අනුවය.**

වත්කමක් එහි ඉහළම හා හොඳම භාවිතයට අනුව භාවිත කිරීමට අස්තිත්ත්වයක් අපේක්ෂා නොකරන්නේ වුවද (උදා: එහි තරගකාරීත්වය ආරක්ෂා කිරීම් එය වෙනත් අය භාවිත කිරීම වැළැක්වීම මගින් අස්තිත්ත්වය ආරක්ෂාකාරී ලෙස භාවිතය සැළසුම් කිරීම) මූල්‍ය නොවන වත්කම වෙළඳපොළ සහභාගීවන්නන් විසින් එහි ඉහළම සහ හොඳම භාවිතය උපකල්පනය කරමින් අස්තිත්ත්වය සාධාරණ අගය මැනිය යුතුය.




**vi.** **වෙළඳපොළ සහභාගි වන්නන්ගේ ගති ලක්ෂණ**

වත්කම හෝ වගකීම මිලකරන විට වෙළඳපොල සහභාගිවන්නන් භාවිත කළ හැකි උපකල්පන, අස්තිත්ත්වයට සාධාරණ අගය මනින විට එම උපකල්පනය භාවිත කිරීම අවශ්‍ය කෙරේ. විශේෂිත වෙළඳපොළ සහභාගිවන්නන් හඳුනාගන්නා වෙනුවට, මනිනු ලබන වත්කම හෝ වගකීම සාමාන්‍යයෙන් ගණුදෙනු කරනු ලබන වෙළඳපොල සහභාගිවන්නන්ගේ ගති ලක්ෂණ අස්තිත්ත්වයක් හඳුනාගත යුතුය. මෙම ගතිලක්ෂණ නිර්ණය කිරීමේදී, වත්කමට හෝ වගකීමට, ප්‍රධාන (හෝ වඩාත් වාසිදායක) වෙළඳපොළ සහ වෙළඳපොළේ වන වෙළඳපොළ සහභාගිවන්නන්ට විශේෂිත වූ සාධක අස්තිත්ත්වය සැළකිල්ලට ගත යුතු අතර සමහර විට සැළකිය යුතු අන්දමේ විචාර බුද්ධියක් ද අවශ්‍ය කෙරේ. උදාහරණයක් ලෙස, ඉඩම් භාවිතයේදී ඉහළම සහ වඩාත් හොඳ දෙයවන්නේ වාසයට සුදුසු නිශ්චල දේපළ සංවර්ධනය කිරීම නම්, නිෂ්පාදන සමාගමක් සතුව ඇති ඉඩම්වල සාධාරණ වටිනාකම මැනීමේදී වාසය සඳහා සුදුසු නිශ්චල දේපොළ හිමි අස්තිත්ත්වයක් වෙළෙඳපොළ සහභාගී වන්නකු ලෙස සැළකිය හැකි වන්නේය. පහත දැක්වෙන සියලු ගතිලක්ෂණ වෙළඳපොළ සහභාගීවන්නන්ට ඇතැයි SLFRS 13 උපකල්පනය කරයි.

- ඔවුන් එකිනෙකාගෙන් ස්වාධීනය. එනම් ඔවුන් සම්බන්ධිත පාර්ශ්ව නොවේ.
- ඔවුන් සාමාන්‍ය සහ සම්ප්‍රදායික මනාව නියැලුණු පරිශ්‍රම මගින් ලබාගන්නා ලබාගත හැකි සියලුම තොරතුරු ඇතුළුව වත්කම සහ වගකීම සම්බන්ධයෙන් සැළකිය යුතු අන්දමේ අවබෝධයක් සහ දැනට ඇත්තෝ වෙති.
- වත්කමක් හෝ වගකීමක් සම්න්ධයෙන් ඒ අයට ගණුදෙනුවලට ඇතුළ්වීමට හැකිය.
- ඔවුන් වත්කමක් හෝ වගකීමක් සඳහා ගණුදෙනුවකට එළඹීමට කැමැත්ත ඇති අයවලුන් වේ. එනම් ඔවුන් අභිප්‍රේරණය වී ඇති නමුදු බලය යොදා එසේ කිරීමට හෝ වෙනත් ලෙසකින් බලෙන් යොමු කිරීමක් එසේ කිරීමට යොමු නොවේ.

**vii. තක්සේරු කිරීමේ ශිල්ප ක්‍රම**

අදාළ **නිරීක්ෂණය කළහැකි යෙදවුම්** භාවිත කිරීම උපරිම කරමින් සහ **නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම්** භාවිතය අවම කරමින් සාධාරණ අගය මැනීමට ලබාගැනීමට ඇති ප්‍රමාණවත් දත්ත සහ තත්ත්වයට උචිත තක්සේරු කිරීමේ ශිල්ප ක්‍රමයක් අස්තිත්ත්වය භාවිත කළ යුතුය. නිරීක්ෂණ කළ හැකි යෙදවුම් වන්නේ වත්කම් හෝ වගකීම් මිල කිරීමේදී වෙළඳපොළ සහභාගිවන්නට භාවිත කරන උපකල්පන පිළිබිඹුවන සත්‍ය සිදුවීම හෝ ගණුදෙනු පිළිබඳව පොදුවේ ලබාගත හැකි වැනි වෙළඳපොළ දත්ත භාවිත කරමින් සංවර්ධනය කළ නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් වන්නේ වෙළඳපොළ දත්ත නොමැති, වත්කම් හෝ වගකීම් මිල කිරීමේදී වෙළඳපොල සහභාගිවන්නන් භාවිත කරන උපකල්පනවල හොඳම තොරතුරු භාවිත කරමින් සංවර්ධනය කරන දෑය.

පුළුල්ව භාවිත කරන තක්සේරු කිරීමේ ශිල්ප ක්‍රම තුනක් වන්නේ, වෙළඳපොළ මග, පිරිවැය මග සහ ආදායම් මග වේ. තක්සේරු කිරීමේ ශිල්ප ක්‍රමය එහි ව්‍යවහාරකරණය වෙනස්වීමක ප්‍රතිඵලයක් ලෙස වන සංශෝධන LKAS 8 ප්‍රකාරව ගිණුම්කරණ ඇස්තමේන්තුවක් වෙනස්වීම ලෙස ගිණුම් තැබිය යුතුය. කෙසේ වෙතත් තක්සේරු කිරීමේ ශිල්ප ක්‍රමයක හෝ එහි ව්‍යවහාරකරණයේ ප්‍රතිඵලයකින් වන සංශෝධන සඳහා LKAS 8 ගිණුම්කරණ ඇස්තමේන්තුවක් සඳහා වන වෙනස්වීම් හි හෙළිදරව් කිරීම් අවශ්‍ය නොවේ.

**viii. තක්සේරු කිරීමේ ශිල්ප ක්‍රමවලට යෙදවුම්**

තක්සේරු කිරීමේ ශිල්ප ක්‍රමවලට වන යෙදවුම් වන්නේ හේ වගකීමක් මිල කිරීමේදී වෙළඳපොළ සහභාගි වන්නේ භාවිත කළ හැකි උපකල්පන වේ.


සාධාරණ අගය පද්ධතිය, සාධාරණ අගය මැනීමට යෙදවුම් මට්ටම් තුනකට ප්‍රවර්ග කරයි.

| | |
|---|---|
| 1 වන මට්ටම | මිනුම්කරණ දින අස්තිත්ත්වයට ප්‍රවේශවිය හැකි සර්වසම වත්කම් හෝ වගකීම් සඳහා සක්‍රීය වෙළඳපොළක මිල කියුම්ලත්/ වෙළඳපොළ මිල ගණන් |
| 2 වන මට්ටම | වත්කම් සඳහා එක්කෝ ඍජුව හෝ වක්‍රව නිරීක්ෂණය කළ හැකි 1 වන මට්ටම තුළ ඇතුළත්, මිල කියුම් ලත්/ වෙළඳපොළ මිල ගණන් හැර යෙදවුම් |
| 3 වන මට්ටම | යෙදවුම් වත්කම සඳහා නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් |

2 වන මට්ටමේ යෙදවුම් වත්කමට නිශ්චිත (ගිවිසුම්ගත) කාලපරිච්ඡේදයක් ඇත්නම්, 2 වන මට්ටමේ යෙදවුම වත්කමේ පූර්ණ කාල සීමාවට සැලකිය යුතු අන්දමින් නිරීක්ෂණය කළ හැකි විය යුතුය.

3 වන මට්ටමේ යෙදවුම්, එනම් අදාළ නිරීක්ෂණය කළ හැකි යෙදවුම් ලබාගත නොහැකි ප්‍රමාණයට, නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් සාධාරණ අගය මැනීමට භාවිත කරනු ලැබේ. ඒ අනුව මිනුම්කරණය දිනට වත්කම සඳහා යම් ක්‍රියාකාරකමක් වේ නම්, එය ඉතා සුළු තත්ත්වයකට පත්වීමට ඉඩ හැරේ. පවතින තත්ත්වයක් යටතේ, ලබාගත හැකි හොඳම යෙදවුම්භාවිත කර නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් සංවර්ධනය කරන අස්තිත්ත්වයක්, සාධාරණ ලෙස ලබා ගත හැකි වෙළඳපොල සහභාගිවන්නට උපකල්පන පිළිබඳ සියලු තොරතුරු ගණන් ගෙන, අස්තිත්ත්වයේ ස්වකීය දත්ත ඇතුළත් කළ හැකිය.

සාධාරණ අගය පද්ධතිය/ ධූරාවලිය සක්‍රීය වෙළඳපොළක සර්ව සම වත්කම් හෝ වගකීම් සඳහා මිල කියුම්ලත් මිල ගණන් වලට (නොගැලපූ) ඉහළම ප්‍රමුඛතාවය දෙන අතර නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් වලට (3 වන මට්ටම) අඩුම ප්‍රමුඛතාවය දේ. එබැවින් සැළකිය යුතු අන්දමේ 3 වන මට්ටමේ යෙදවුම් භාවිත කර සාධාරණ අගය ඇස්තමේන්තු කිරීමේදී වෙළඳපොළ දත්ත නොමැතිවීම නිසා බොහෝ විට ආවේණිකව අභියෝගාත්මක වේ.




\+ අදාළ නිරීක්ෂණය කළ හැකි යෙදවුම් උපරිම කිරීම නිරීක්ෂණය කළ හැකි යෙදවුම්වලට වෙළෙඳපොළ දත්ත ඇතුළත් වේ. (පොදුවේ ලබාගත හැකි මිල ගණන් සහ වෙනත් තොරතුරු)

\# නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම්වල අස්තිත්ත්වයේ ස්වකීය දත්ත ඇතුළත් වේ. (අයවැය ලේඛන, පුරෝකථන), වෙළෙඳපොළ සහභාගීවන්නන් වෙනත් උපකල්පන භාවිත කරන්නේ නම් ඒවා ගැලපිය යුතුය.

| | වෙළඳපොළ මග වෙළඳපොළ මිල ලබා ගත හැකිය. | ආදායම් මග (උදා: වට්ටම් කළ මුදල් ප්‍රවාහ) | පිරිවැය මග (උදා: ප්‍රතිසම්පාදන මිල) |
|---|---|---|---|
| 1 වන මට්ටම | • **සර්ව සම අයිතම සඳහා මිල**<br>• **ගැළපීම් නොකර භාවිත කළ යුතුය.** | • සෘජුව හඳුනාගත හැකි මුදල් ප්‍රවාහ | • සෘජුව ආදායම් නොනිපදවන<br>• සර්වසම වෙළඳපොල මිලක් නැත<br>• මිල ගැලපීම අවශ්‍ය වේ. |
| 2 වන මට්ටම | • මිල ගැලපීම අවශ්‍ය වේ.<br>• **නිරීක්ෂණය කළ හැකි යෙදවුම්** | • **නිරීක්ෂණය කළ හැකි යෙදවුම්**<br>• **කලාතුරකින්** | • **නිරීක්ෂණය කළ හැකි යෙදවුම්**<br>• **කලාතුරකින්** |
| 3 වන මට්ටම | • මිල ගැලපීම අවශ්‍ය වේ.<br>• **නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම්** | • **නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම්** | • **නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම්** |

ව්‍යාපාරයක වැනි, වත්කම්, වගකීම් හෝ වත්කම් හෝ වගකීම සමූහයක සර්වසම හෝ සංසන්දනය කළහැකි වෙළෙඳපොළ සම්බන්ධ ගණුදෙනු මගින් උත්පාදනය වන වෙනත් තොරතුරු සහ මිල ගණන් **වෙළෙඳපොළ මග** භාවිත කරයි.

උදා: සමාන කළහැකි දෑ කට්ටලයකින් වෙළෙඳපොළ බොහෝ දෑ උත්පාදනය වේ.

වත්කමක සේවා ධාරිතාව වර්තමානයේදී ප්‍රතිසම්පාදනය කිරීමට අවශ්‍ය විය හැකි වටිනාකම **පිරිවැය මග** මගින් පිළිඹිබු වේ. (ප්‍රවර්තන ප්‍රතිසම්පාදන මිල ලෙස බොහෝවිට හැඳින්වෙන) වෙළෙඳපොළ සහභාගීවන විකුණුම්කරුවෙකුගේ සාපේක්ෂ වැදගත්කම පැත්තෙන් ගත්කළ, වත්කම සඳහා ලැබිය යුතු මිල පදනම් වන්නේ, යල් පැනීම්වලට ගැළපූ පසු වෙළෙඳපොළ සහභාගීවන ගැණුම්කරුවෙකු වත්කම අත්කර ගැනීමට වන පිරිවැය හෝ සැසඳිය හැකි උපයෝගීතාවයක් ඇති ආදේශක වත්කමක් තැනීමට වන පිරිවැයයි. යල් පැනීම, භෞතික ගුණ හීනවීම, කාර්ය බද්ධ (තාක්‍ෂණික) යල් පැනීම, ආර්ථික (බාහිර) යල් පැනීම ආවරණය වේ සහ එය මුල්‍ය වාර්තාකරණ අරමුණ (ඓතිහාසික පිරිවැය වෙන් කිරීම හෝ බදු අරමුණ සඳහා (නිශ්චිත සේවා ජීව කාලයක් භාවිත කරමින්) වන ක්‍ෂය කිරීම වඩා පුළුල්ය.උදා: ප්‍රවර්තන ප්‍රතිසම්පාදන පිරිවැය ක්‍රමය/ ක්‍ෂය කරන ලද ප්‍රතිසම්පාදන පිරිවැය.

**ආදායම් මග** අනාගත වටිනාකම් (උදා: මුදල් ප්‍රවාහයේ ආදායම් සහ වියදම්) තනි වටිනාකමකට (එනම් වට්ටම් කළ) පරිවර්තනය කරයි. ආදායම් මග භාවිත කරන විට එම අනාගත වටිනාකම් පිළිබඳව ප්‍රවර්තන වෙළඳපොළ අපේක්ෂාවන් සාධාරණ වටිනාකම මැනීම පිළිබිඹු කරයි. එම තක්සේරු කිරීමේ ශිල්ප ක්‍රම උදාහරණ වශයෙන් පහත දෑ ඇතුළත් වේ.

(අ) වර්තමාන අගය ශිල්ප ක්‍රමය

වර්තමාන අගය ශිල්ප ක්‍රමය භාවිත කරමින් වත්කමක සාධාරණ අගය මැනීමකදී මිනුම් කරන දින වෙළඳපොළ සහභාගී වන්නකුගේ සාපේක්ෂ වැදගත්කම පැත්තෙන් ගත්කළ පහත සඳහන් සියළුම දෑ ග්‍රහණය කරයි.

i. මනිනු ලබන වත්කම සඳහා අනාගත මුදල් ප්‍රවාහවල ඇස්තමේන්තුවක්

ii. මුදල් ප්‍රවාහවල ආවේණික වූ අනියතාවය නියෝජනය කරමින් මුදල් ප්‍රවාහවල වටිනාකම සහ කාල සැකසුම (එනම් අවම ප්‍රකාශිත කාලපරිච්ඡේදයක්වන වසර 5 ක්)පිළිබඳ විය හැකි විචල්‍යතාවයන්ගේ අපේක්ෂාවන්

iii. අවදානම් රහිත පොලී අනුපාතිකය නියෝජනය කිරීම මගින් මුදලේ කාල වටිනාකම්

iv. අවදානම් වාරිකය

v. පවතින තත්ත්වයේ දී වෙළඳපොළ සහභාගීවන්නන් ගණන් ගන්නා වෙනත් සාධක

(ආ) සමහර අස්පෘශ්‍ය වත්කම්වල සාධාරණ අගය මැනීමට භාවිත කරන බහු කාලපරිච්ඡේද අතිරික්ත ඉපයීමේ ක්‍රමය

මැනීමේ අනියතාවේ ගැලපුම් සඳහා ඇතුළුව මිනුම් කරන දින වෙළඳපොළ තත්ත්වයන් යටතේ මූල්‍ය වත්කමක් මිල කරන විටදී වෙළඳ මිල සහභාගීවන්නන් එම ගැළපුම් කල හැකි නිසාවෙන්, අස්තිත්ත්වයක් තක්සේරු කිරීමේ ශිල්පක්‍රමයක් භාවිත කරන විට තක්සේරු කිරීමේ ගැළපුම් කිරීම අවශ්‍ය විය හැකිය.

අස්තිත්ත්වයක් සංගත තක්සේරු කිරීමේ ශිල්ප ක්‍රමයක් ව්‍යවහාර කළ යුතු අතර වෙනසකට ඉඩ දෙන්නේ සීමිත සහ සාධාරණීය කළ තත්ත්වයන් යටතේ පමණි.

## ix නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් භාවිත කරන තක්සේරු කිරීමේ ශිල්පක්‍රම ක්‍රමාංකනය කිරීම

මූලික හඳුනා ගැනීමේදී ගණුදෙනු පිරිවැය සාධාරණ අගය නම් සහ පසු කාලපරිච්ඡේදවලදී සාධාරණ අගය මැනීමට නිරීක්ෂණය නොකළ යෙදවුම් භාවිත කරන තක්සේරු ශිල්ප ක්‍රමයක් භාවිත කළේ නම්, තක්සේරු කිරීමේ ශිල්පක්‍රමය ක්‍රමාංකනය කළ යුතුය. ඒ අනුව මූලික හඳුනා ගැනීමේදී තක්සේරු ශිල්පක්‍රමයේ ප්‍රතිඵල ගණුදෙනු පිරිවැයට සමාන වේ.

ක්‍රමාංකනයෙන් තක්සේරු ශිල්පක්‍රමය ප්‍රවර්තන වෙළඳපොළ තත්ත්වය පිළිබිඹු වන බව සහතික වේ. සහ එය තක්සේරු ශිල්ප ක්‍රමයට ගැළපුමක් අවශ්‍ය දැයි අස්තිත්ත්වයට නිර්ණය කිරීමට උපකාරී වේ. (උදාඃ තක්සේරු ශිල්පක්‍රමය විසින් ග්‍රහණය නොකළ වත්කමේ ගති ලක්ෂණ තිබිය හැකිය. මූලික හඳුනා ගැනීමෙන් පසුව තක්සේරු ශිල්ප ක්‍රමයක් භාවිත කර හෝ නිරීක්ෂණය නොකළ යෙදවුම් භාවිත කරන ශිල්ප ක්‍රම භාවිත කර මිනුම්කරන දින සාධාරණ අගය මනින විට එම තක්සේරු ශිල්පක්‍රම නිරීක්ෂණය කළ වෙළඳපොළ දත්ත පිළිබිඹුවන වගට අස්තිත්ත්වයක් සහතික විය යුතුය. (උදාඃ එක හා සමාන වත්කමක් සඳහා මිල)

## 10. සංරචක කරණය/ කොටස්කරණය සහ ක්ෂය කිරීම

මෙම ප්‍රවේශයේ ප්‍රධාන පරමාර්ථය වනුයේ වත්කමේ අනාගත ආර්ථික ප්‍රතිලාභ අස්තිත්ත්වය විසින් කෙසේ පරිභෝජනය කිරීමට අපේක්ෂා කරන රටාව වඩා නිරවද්‍යව පිළිබිඹු කිරීමටය.

**හඳුනා ගැනීම සහ ක්ෂය කිරීම**

ධාරණ අගය ඓතිහාසික පිරිවැයවන පදනම් වන විට, එම සංරචකවල පිරිවැය එකතුවට සාපේක්ෂව සැළකිය යුතු අන්දමේ පිරිවැයක් ඇති සහ ප්‍රමාණාත්මක ලෙස වෙනස් ප්‍රයෝජ්‍ය ජීව කාලයක් ඇති යන දෙකම කරදරයක් නොමැතිව හඳුනාගත යුතුය. (IVS 300 හි G 16)

අයිතමයේ ධාරණ වටිනාකම පදනම් වන්නේ සාධාරණ අගය/ ප්‍රත්‍යාගණනය වනවිට, අයිතමයේ සාධාරණ අගය සංරචක අතරේ වෙන් කිරීමක් කිරීම අවශ්‍ය වේ.

පිරියතක් හෝ උපකරණ අයිතමයක සංරචකයකට සක්‍රීය වෙළඳපොළක් ඇත්නම් එම සංරචකයකට ආරෝපණයවන වටිනාකම නිර්ණය කිරීමට හැකිවුවත්, වෙනත් අවස්ථාවලදී සංරචක සක්‍රීයව අලෙවි නොවීමට පුළුවන. ගොඩනැගිල්ලක සංරචක පසුව සඳහන් කළ දැට උදාහරණයකිඃ උදාඃ තාපය, විදුලිබලය, වාතනය සඳහා අවශ්‍ය යාන්ත්‍රික සහ විද්‍යුත් සේවා නොමැතිව

ගොඩනැගිල්ලක් විකුණන්නේ කලාතුරකින් සහ ගොඩනැගිල්ල නොමැතිව ස්ථාපනය කළ පිරියත විකිණිය නොහැකිය. (IVS 300 හි G 17)

වටිනාකම එක් එක් සංරචකයට විශ්වාසදායක ලෙස තීර්ණය කිරීමට නොහැකිවිට සම්පූර්ණ ගොඩටම ආරෝපිත වටිනාකම සංරචකවලට අනුපාතනය කෙරේ. අයිතමයේ පිරිවැයට සම්පූර්ණ ගොඩේ පිරිවැය අතර අනුපාතය එවැනි අනුපාතනය කිරීමට උචිත පදනම විය හැකිය. අයිතමයේ සම්පූර්ණ පිරිවැයට සාපේක්ෂව දේපළ, පිරියත සහ උපකරණ එක් එක් අයිතමයේ පිරිවැය සැළකිය යුතු අන්දමේ නම් සහ වෙනස් ප්‍රයෝජ්‍ය ජීව කාලයක් ඇත්නම් වෙන් වෙන්ව ක්ෂය කළ යුතුය. (LKAS 16 හි 43 වන ඡේදය)

නොනවත්වා මෙහෙයුම් කටයුතු කරන තත්ත්වයක වන දේපළ, පිරියත සහ උපකරණ (උදාහරණයක් වශයෙන් ගුවන් යානයක්) අයිතමයක අයිතමයේ කොටස් ප්‍රතිසම්පාදනය කළේද යන්න නොසළකා දෝෂ සඳහා ප්‍රතිපත්තියකට අනුව විශාල සෝදිසි කිරීම් සිදු කරනවා විය හැකිය. සෑම විශාල සෝදිසි කිරීමක් සිදුකරන විට එහි පිරිවැය, හඳුනා ගැනීමේ නිර්නායකය සපුරාලන්නේ නම් දේපළ, පිරියත සහ උපකරණ අයිතමයේ ධාරණ වටිනාකමේ හඳුනා ගැනේ. පෙර වූ සෝදිසි කිරීමේදී භෞතික කොටස් වලින් වෙන්කොට හඳුනා ගත් වූ පිරිවැයේ, ධාරණ වටිනාකමේ ඉතිරිව ඇති යම් වටිනාකමක් ප්‍රතිහඳුනා ගැනේ. පෙර වූ සෝදිසි කිරීමේ පිරිවැය අත්කරගත් හෝ තනන ලද අයිතමය සඳහා වූ ගණුදෙනුවේ හඳුනා ගත්තද යන්න නොසළකා මෙය සිදු වේ. අයිතමය අත්කරගත් හෝ තනන අවස්ථාවේදී සංරචක සෝදිසි කිරීමේ පවතින පිරිවැය කුමක්දැයි යන්න ඇගවීමට අවශ්‍ය කරන්නේ නම්, අනාගතයේ කරනු ලබන ඒ හා සමාන සෝදිසි කිරීම් වල ඇස්තමේන්තු කළ පිරිවැය භාවිත කළ හැකිය.

**ප්‍රතිහඳුනා ගැනීම් (LKAS 16හි 70 වන ඡේදය)**

හඳුනා ගැනීමේ මූලධර්ම යටතේ (LKAS 16 හි 7 වන ඡේදයේ) දේපොල, පිරියත සහ උපකරණ අයිතමයක ධාරණ වටිනාකම තුළ, අයිතමයක කොටසක් ප්‍රතිසම්පාදනය කිරීමේ පිරිවැය හඳුනාගෙන ඇත්නම්, ප්‍රතිසම්පාදනය කළ කොටස වෙනම ක්ෂය කර තිබිය වුවද එය නොසළකා ප්‍රතිසම්පාදනය කළ කොටසේ ධාරණ වටිනාකම ප්‍රතිහඳුනා ගැනේ. ප්‍රතිසම්පාදනය කළ කොටසේ ධාරණ වටිනාකම අස්තිත්ත්වය තීර්ණය කිරීම ප්‍රායෝගික නොවන්නේ නම්, වත්කම අත්කර ගත් හෝ තනන ලද අවස්ථාවේ ප්‍රතිසම්පාදනය කිරීම ප්‍රායෝගික නොවන්නේ නම්, වත්කම අත්කරගත් හෝ තනන ලද අවස්ථාවේ ප්‍රතිසම්පාදනය කළ කොටසේ පිරිවැය කුමක්ද යන්න ලෙස ඇගවීමට ප්‍රතිසම්පාදනයේ පිරිවැය භාවිත කළ හැකිය.

## 11. වත්කම් හුවමාරුව

හුවමාරු ගණුදෙනුවට වාණිජ අර්ථයක්/ හරයක් නොමැති නම් (එනම් අස්තිත්ත්වයේ ආර්ථිකයට පැහැදිලිව දකින බලපෑමක් ගණුදෙනුවට නොතිබීම) හෝ හුවමාරු කළ වත්කම් එකතුවක් සාධාරණ අගය විශ්වාසදායක ලෙස තීර්ණය කළ නොහැකි නම්, එවිට හුවමාරු කිරීමෙන් අත්කරගත් වත්කමේ පිරිවැය මැනිය යුත්තේ අත්හල වත්කමේ ධාරණ වටිනාකමටය. මේ හැර මූල්‍ය නොවන වත්කමේ හුවමාරු කිරීම සඳහා අත්කරගත් දේපළ පිරියත හෝ උපකරණ සියලුම අයිතමයන් හෝ එසේ හුවමාරු කරගත් මූල්‍ය සහ මූල්‍ය නොවන සියළු අයිතම්වල සංයෝජනයක් මැනිය යුත්තේ සාධාරණ අගයටය.

ගණුදෙනුවකට වාණිජ හරයක් ඇත්දැයි ඇගයීමේදී ගණුදෙනුව මගින් බලපෑ මෙහෙයුම් කොටසින් සාධාරණ ලෙස උත්පාදනය වීමට අපේක්ෂා කරන බදු වලට පසු මුදල් ප්‍රවාහවල වර්තමාන අගය අස්තිත්ත්වය ගණනය කළ යුතුය. වට්ටම් අනුපාතිකය පිළිබිඹු කළ යුත්තේ අස්තිත්ත්වයේ මුදලේ කාල වටිනාකමේ ප්‍රවර්තන තක්සේරුව සහ එම මෙහෙයුම්වලට විශේෂිත මෙහෙයුම් මිස වෙළඳපොල සහභාගී වන්නන් කරනු ලබන වට්ටම් අනුපාතික නොවේ.

## 12. වත්කම් හානිකරණය

සෑම වාර්තා කරනු ලබන කාලපරිච්ඡේදයක් අවසානයේදීම වත්කම් හානිකරණය වී ඇත්දැයි කරනු ලබන යම් ඇඟවීමක් තිබේදැයි අස්තිත්ත්වයක් තක්සේරු කළ යුතුය. එවැනි ඇඟවීමක් පවතී නම් වත්කමේ අයකර ගත හැකි වටිනාකම අස්තිත්ත්වයක් ඇස්තමේන්තු කළ යුතුය.

වත්කමක් හානිකරණය වී ඇත්දැයි යම් ඇඟවීමක් තිබේදැයි තක්සේරු කිරීමේදී අස්තිත්ත්වයන් අවම වශයෙන් පහත සඳහන් ඇඟවීම් සැළකිල්ලට ගත යුතුවේ.

*බාහිර තොරතුරු මූලාශ්‍රයන්*

(අ) කාලයගත වීම සහ සාමාන්‍ය භාවිත කිරීමේ ප්‍රතිඵලයක් නිසා අපේක්ෂාකරන ප්‍රමාණය වඩා සැළකිය යුතු අන්දමට වාර්තා කරන ලද කාලපරිච්ඡේදය තුළ වත්කමේ අගය පහත වැටී ඇති බවට නිරීක්ෂණය කළ හැකි ඇඟවීම් ඇතිවිටක දී,

(ආ) අස්තිත්ත්වයට අහිතකර බැලපෑම් සිදු වී අස්තිත්ත්වය මෙහෙයුම් සිදුකරන හෝ වත්කම වෙන්කරන ලද වෙළඳපොළ කාලපරිච්ඡේදය තුළ දී හෝ නුදුරු අනාගතයේදී සිදුවෙතැයි අපේක්ෂා කරන තාක්ෂණික වෙළඳපොළ හා නෛතික පරිසරයේ වෙනස්වීම්

(ඇ) වත්කමේ ප්‍රයෝජ්‍ය අගය ගණනය කිරීමේදී භාවිත කළ වට්ටම් අනුපාතිකයට බලපෑ හැකි සහ වත්කමේ අයකර ගත හැකි වටිනාකම සැළකිය යුතු අන්දමින් අඩුවීමට බලපෑ හැකි කාලපරිච්ඡේදයකදී වෙළඳපොල පොලී අනුපාතික හෝ ආයෝජන මත ප්‍රතිලාභ වලට වන වෙනත් වෙළඳපොල අනුපාතිකවල ඉහළ යාම්;

(ඈ) වෙළඳපොළ ප්‍රාග්ධනීයකරණයට වඩා අස්තිත්ත්වයක ශුද්ධ වත්කම්වල ධාරණ වටිනාකම වැඩිවීම.

*අභ්‍යන්තර තොරතුරු මූලාශ්‍ර*

(ඉ) වත්කම අභාවිත හෝ භෞතික වශයෙන් හානිවී ඇති බවට සාක්ෂි තිබීම.

(ඊ) අස්තිත්ත්වයට අහිතකර ලෙස බලපෑ හැකි වත්කම භාවිත කරන ප්‍රමාණයට හෝ ස්වභාවයට හෝ භාවිත කිරීමට අපේක්ෂා කරන ආකාරයට කාලපරිච්ඡේදය තුළදී හෝ නුදුරු අනාගතයේදී සිදුවිය හැකි සැළකිය යුතු අන්දමේ වෙනස්කම්. මෙම වෙනස්වීම් වලට වත්කම අක්‍රීය බවට පත්වීම, වත්කම අයත් මෙහෙයුම් නැවැත්වීමට හෝ ප්‍රතිව්‍යුහගත කිරීම් සැළසුම්, කලින් අපේක්ෂා කළ දිනට හෝ අස්තිත්ත්වය බැහැර කිරීම් සැළසුම් සහ වත්කමේ ප්‍රයෝජ්‍ය ජීව කාලය අනියත කාලයක සිට නියත කාලයක් ලෙස යළි තක්සේරු නොකිරීම ඇතුළත්ය.

(උ) වත්කමේ ආර්ථික කාර්ය සාධන බලාපොරොත්තු වූවාට වඩා අහිතකර හෝ අහිතකර වියහැකි බවට අභ්‍යන්තර වාර්තාකරණය මගින් සාධක තිබීම.

**වත්කම හානිකරණය වනුයේ**

⇩

ධාරණ අගය **(CA)** **>** අයකරගත හැකි වටිනාකම **(RA)**

(ගිණුම්කරණ වර්තා) සාධාරණ අගයට විශාල - විකිණීමට වන පිරිවැය සහ ප්‍රයෝජ්‍ය අගය

⇩

**(CA - RA =** හානිකරණ අලාභය)

## 13. මූල්‍ය වාර්තාකරණ අරමුණු සඳහා වත්කම් අගය කිරීම මත තක්සේරු විශේෂඥයන් සමඟ වැඩ කිරීම

අන්තර්ජාතික තක්සේරු කිරීමේ ප්‍රමිත (IVS) ආකෘතිමය රාමුවේ නිර්වචනය කර ඇති සහ සාකච්ඡා කරන ලද පරිදි ලෙස මෙන් නොව IFRS (ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් SLFRS) යටතේ සාධාරණ අගය වෙනස් සංකල්පයකි. එබැවින් ගිණුම් ඒකක වෙත කොන්දේසියක් වැනි SLFRSs මගින් අවශ්‍යකරණ සමහර නිශ්චිත උපකල්පන වලට යටත් වූ IVS යටතේ වෙළඳපොළ අගය, SLFRS 13 යටතේ සාධාරණ අගය මැනීමේ අවශ්‍යතාවයන් මඟ වඩාත් සංගත වේ. සාධාරණ අගය IVS නිර්වචනය කරන්නේ පවතින තත්ත්වය යටතේ සාධාරණ වන වටිනාකම ලෙස හෝ එයට සහ ක්‍රියාකාරකම්වල වැනි දෑ වල වටිනාකම

ගණන් ගත හැකිය. පාරිභාෂික ශබ්ද මාලාවේ වෙනස්කම් නොසළකා වෙළඳපොළ සහභාගීවන්නන්ගේ සාපේක්ෂ වටිනාකම පැත්තෙන් ව්‍යවහාර කරනවිට SLFRS 13 හි (ඉහළ හෝ වඩාත් හොඳ භාවිතය වැනි බොහෝ වෙනස් සංකල්ප සහ ශිල්ප ක්‍රමවලට වඩා වෘත්තීයතක්සේරු කරුවෙකුට වඩා හුරුපුරුදුය.

## 14. මූල්‍ය වාර්තාකරණ අරමුණ සඳහා තක්සේරුකරුවෙකුගේ වැඩ භාවිත කිරීම මත විගණකයන්ට උපදේශන

අස්තිත්ත්වයක මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීමේ දී ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ව්‍යවහාර (SLAUSs) කළ යුතුවේ. එවැනි ප්‍රමිතවල ස්වභාවය අනුව ව්‍යවහාරකරණය කිරීමේ දී විගණන වෘත්තිය විචාර බුද්ධිය අදාළ කරගැනීම අවශ්‍ය කෙරේ.

සාධාරණ අගය මැනීමට ඇස්තමේන්තු කිරීම සහ එවැනි වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමට එළඹීමට තක්සේරු ප්‍රවීණයෙකුගේ සේවය කළමනාකාරිත්වයට ලබා ගැනීම අවශ්‍ය විය හැකිය. කළමනාකාරිත්වය ප්‍රවීණයකුගේ හෝ විගණකගේ ප්‍රවීණයෙකුගේ වැඩ භාවිත කිරීමට විගණක තීරණය කළ හැකිය. එවැනි ඇස්තමේන්තුවක වටිනාකම් සහ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර ඇති වටිනාකම් සාධාරණ සහ ප්‍රමාණවත් ද යන්න පිළිබඳ ප්‍රමාණවත් සහ උචිත සාක්ෂි ලබාගැනීමට ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 540 *ගිණුම්කරණ ඇස්තමේන්තු විගණනයසාධාරණ අගය ගිණුම්කරණය සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම* ඇතුළුව මගින් විගණකට මග පෙන්වයි.

විගණක සාක්ෂි ලෙස භාවිත කළ යුතු තොරතුරු පිළියෙල කළේ කලමනාකාරීත්වයේ ප්‍රවීණයෙකුගේ වැඩ භාවිත කර, නම් විගණකගේ අරමුණු සඳහා එම ප්‍රවීණයාගේ වැඩවල වැදගත්කම සැළකිල්ලට ගැනීමෙන් අවශ්‍ය කරන ප්‍රමාණයට විගණක,

(අ) එම ප්‍රවීණයාගේ දක්ෂකම හැකියාව සහ අරමුණුගතභාවය ඇගයීම

(ආ) එම ප්‍රවීණයාගේ වැඩ පිළිබඳව අවබෝධයක් ලබාගැනීම සහ

(ඇ) අදාළ සැදහුම් සඳහා විගණක සාක්ෂි ලෙස එම ප්‍රවීණයාගේ වැඩවල උචිතභාවය ඇගයීම ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 500 *විගණන සාක්ෂි* හි 9 වන ඡේදයේ සඳහන් වේ.

ඉහත සඳහන් SLAUS හි ව්‍යවහාරකරන උපදේශවල අ 34 සිට අ 48 ඡේදවල පහත දැ සඳහන් වේ.

ප්‍රවීණයෙකුගේ ප්‍රමිතයකුගේ වැඩ විගනක භාවිත කිරීමට අදහස් කරන විට ඔහුගේ වගකීම් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත SLAUS 620 *විගනකගේ ප්‍රවීණයකුගේ වැඩ භාවිත කිරීමෙහි* නියම කර ඇත. එම ප්‍රමිතයේ 9 වන ඡේදය අනුව ඔහුගේ ප්‍රවීණයාට විසනකගේ අරමුණු සඳහා අවශ්‍ය දක්ෂකම, හැකියාව සහ අරමුණුගතභාවය තිබේදැයි විගණක විසින් ඇගයිය යුතුය. තව ද එම ප්‍රවීණයාගේ, ස්වභාවය, විෂය පථය සහ අරමුණු නිර්ණය කිරීමට හැකිවීම පිණිස සහ විගණකගේ අරමුණු සඳහන් ප්‍රවීණයාගේ වැඩවල ප්‍රමාණවත්බව ඇගයීමට විගනක ප්‍රවීණයා, ප්‍රවීණත්වයක් ලබාගත් ක්ෂේත්‍රය පිළිබඳව ප්‍රමාණවත් අවබෝධයක් ලබාගත යුතුය. මෙයට අමතරව ප්‍රවීණයා සමග පහත සඳහන් කරුණු පිළිබඳව එකඟවීමක් 11 වන ඡේදයෙන් අවශ්‍ය කෙරේ.

(අ) එම ප්‍රවීණයාගේ වැඩවල ස්වභාවය, විෂය පථය සහ අරමුණ

(ආ) විගණකගේ සහ එම ප්‍රවීණයාගේ අදාළ භූමිකා සහ වගකීම්

(ඇ) එම ප්‍රවීණයා ලබාදිය යුතු යම් වාර්තාවක ආකෘතිමය ඇතුළුව විගණක සහ එම ප්‍රවීණයා අතරවන සංනිවේදයේ ස්වභාවය, කාල සැකසුම සහ ප්‍රමාණය සහ

(ඈ) රහස්‍යභාවය පිළිබඳ අවශ්‍යතාවයන් විගණක ප්‍රධානියා පිළිපැදීමේ අවශ්‍යතාවය.

සාධාරණ අගය විකුණුම්කරණය සහ හෙළිදරව් කිරීම් SLFRSs සමග අනුකූලවන වගට සාධාරණ සහතිකවීමක් ලබාදීමට ප්‍රමාණවත් උචිත විගණක සාක්ෂි විගණක විසින් ලබාගත යුතුය.

## 1 වන ඇමුණුම - වාර්තාවේ අන්තර්ගතය

තක්සේරු කිරීම නිසි ලෙස අවබෝධ කර ගැනීමට තොරතුරු සංනිවේදනය කිරීමේ අරමුණ සඳහා මූල්‍ය වර්තාකරණයේ අරමුණු සඳහා පිළියෙල කරනු ලැබේ. අගය කිරීමේ වාර්තාවේ පහත සඳහන් තොරතුරු ඇතුළත් කිරීම නිර්දේශ කෙරේ.

(අ) තක්සේරුකරු හඳුනා ගැනීම සහ තරාතිරම

(ආ) සේවාදායකයා සහ අපේක්ෂිත භාවිත කරන්නන් හඳුනා ගැනීම

(ඇ) අගය කිරීමේ අරමුණ

(ඈ) අගය කළ යුතු වත්කම හඳුනා ගැනීම

(ඉ) අගය කිරීමේ පදනම

(ඊ) අගයකිරීම සඳහා සළකා බැලූ ඉහළ සහ උසස් භාවිතය

(උ) විමර්ශනය කළ ප්‍රමාණය

(ඌ) වත්කම ඇඳුන සම්බාධක සහ අගය කිරීම මත බලපෑම

(එ) විශ්වාසය තැබූ තොරතුරුවල ස්වභාවය සහ මූලාශ්‍රය

(ඒ) උපකල්පන සහ විශේෂ උපකල්පන

(ඔ) මෙම උපදේශ සමග අගය කිරීම අනුකූලවන වග සනාථ කිරීම

(ඕ) හේතු සහිතව අගය කිරීමේ ප්‍රවේශය

(අඅ) අගය කිරීමේ වටිනාකම සහ පරාසය

(අආ) අගය කිරීමේ වාර්තාවේ දිනය සහ අගය කිරීම බලාත්මකවන දිනය

1. අස්තිත්ත්වයක පරිශීලකයනට මූල්‍ය ප්‍රකාශන තක්සේරු කිරීම පහසුවීමට පහත දෙකටම අදාළ තොරතුරු හෙළිදරව් කිරීම

**2වන ඇමුණුම - SLFRS13 යටතේ අවශ්‍ය කරන සාධාරණ අගය හෙළිදරව් කිරීම.**

| යොමුව | හෙළිදරව් කිරීම | Y/N/NA |
|---|---|---|
| **SLFRS 13 91** ඡේදය | (අ) මූලික හඳුනා ගැනීමෙන් පසුව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, පුනරාවර්තනයවන සහ පුනරාවර්තනය නොවන පදනම මත සාධාරණ අගය මනින ලද වත්කම් සහ වගකීම් සඳහා; එම මිනුම්කරණය සංවර්ධනය කිරීමට භාවිත කළ තක්සේරු කිරීමේ ශිල්ප ක්‍රමය සහ යෙදවුම්<br><br>(ආ) සැළකිය යුතු අන්දමේ නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් (3 වනමට්ටම) භාවිත කරමින් පුනරා-වර්තනයවන සාධාරණ අගය මැනීම සඳහා, මැනුම් කිරීම මත කාලපරිච්ඡේදය සඳහා ලාභ හෝ අලාභවලට හෝ වෙනත් විස්තීර්ණ ආදායමට වන බලපෑම. | |
| **SLFRS 13 92** (ආ)-(ඇ) ඡේද | SLFRS 13 හි 91 වන ඡේදයේ පරමාර්ථ ඉෂ්ඨ කර ගැනීමට පහත සඳහන් සියල්ල සැළකිල්ලට ගැනීම.<br><br>(අ) හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවයන් සපුරාලීමට අවශ්‍ය විස්තරවල මට්ටම<br>(ආ) විවිධ අවශ්‍යතාවයන් එකිනෙකට කොපමණ අවධාරණය තැබිය යුතුය<br>(ඇ) කොපමණ සමාහරණය සහ කොටස්වලට විසුරුවා හැරීම භාරගත යුතු ද<br>(ඈ) හෙළිදරව් කළ ප්‍රමාණාත්මක තොරතුරු ඇගයීමට මූල්‍ය ප්‍රකාශන පරිශීලකයනට අමතර තොරතුරු අවශ්‍ය වේද? | |
| | 2. මෙම SLFRS සහ වෙනත් SLFRSs ප්‍රකාරව ලබාදී ඇති හෙළිදරව් කිරීම් SLFRS 13 හි 91 වන ඡේදයේ අරමුණු සපුරාලීමට ප්‍රමාණවත් නොවේ නම්, එම අරමුණු ඉටුකිරීමට අවශ්‍ය අමතර තොරතුරු හෙළිදරව් කිරීම. | |
| **SLFRS 13** 93 (අ) - (1) ඡේද | 3. මූලික හඳුනා ගැනීමෙන් පසුව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සාධාරණ අගයට මනින ලද (මෙම SLFRS හි විෂය පථය තුළ සාධාරණ අගය මත පදනම්ව මනිනු ලැබූ ඇතුළුව) අවමයක් වශයෙන් එක් එක් පන්තියේ වත්කම් සඳහා පහත සඳහන් තොරතුරු (උචිත පන්තිවල වත්කම් සහ වගකීම් නීර්ණය කිරීම මත තොරතුරු සඳහා SLFRS 13 හි 94 වන ඡේදය බලන්න) SLFRS 13 හි 91 වන ඡේදයේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා හෙළිදරව් කළ යුතුය.<br><br>(අ) පුනරාවර්තනය වන සහ පුනරාවර්තනය නොවන සාධාරණ අගය මැනීම සඳහා, වාර්තාකරණ කලපරිච්ඡේදය අවසානයේ සාධාරණ අගය මැනීම සහ පුනරාවර්තනය නොවන සාධාරණ අගය මැනීම සඳහා මැනීම සඳහාවන හේතු,<br>(ආ) පුනරාවර්තනයවන සහ පුනරාවර්තනය නොවන සාධාරණ අගය මැනීම සඳහා, ඒවායේ සමස්ථයේ (1, 2 හෝ 3 වන මට්ටම) වර්ගීකරණ සාධාරණ අගය මැනීම තුළ සාධාරණ අගය පද්ධතියේ<br>(ඇ) පුනරාවර්තන පදනම මත වන වාර්තාකරණ ලද කාලපරිච්ඡේදය අවසන රඳවාගෙන ඇති සාධාරණ අගයට මනින වත්කම් සහ වගකීම් සඳහා 1 වන සහ 2 වන මට්ටම් සාධාරණ අගය පද්ධතිය අතර යම් මාරු කිරීම්වල වටිනාකම් එම මාරු කිරීම්වලට හේතු සහ මට්ටම් අතර මාරු කිරීම් සිදුවූවායැයි හැඟෙන බව නීර්ණය කිරීමට වන අස්තිත්ත්වයේ ප්‍රතිපත්තිය. එක් එක් මට්ටම තුළට කරන ලද මාරු කිරීම් හෙළිදරව් කරන අතර එක් එක් මට්ටමෙන් පිටතට කරනු ලබන මාරු කිරීම් වෙනම සාකච්ඡා කෙරේ. | |

(ඇ) සාධාරණ අගය පද්ධතියේ, 2 වන මට්ටම සහ 3 වන මට්ටම තුළ වර්ගීකරණය කළ පුනරාවර්තනයවන සහ පුනරාවර්තනය නොවන සාධාරණ අගය මැනීම සඳහා, සාධාරණ අගය මැනීමේදී භාවිතා කළ තක්සේරු ශිල්ප ක්‍රමය(න්) සහ යෙදවුම්වල විස්තරයක්, තක්සේරු ශිල්ප ක්‍රමයේ වෙනසක් වී ඇත්නම්, එම වෙනස සහ එසේ කිරීම හේතුව(න්) හෙළිදරව් කිරීම.

සාධාරණ අගය පද්ධතියේ 3 වන මට්ටමේ වර්ගීකරණයකළ සාධාරණ අගය මැනීම සඳහා සාධාරණ අගය මැනීමේදී භාවිතකළ නිරීක්‍ෂණය නොකළ සැළකිය යුතු අන්දමේ යෙදවුම් පිළිබඳව ප්‍රමාණාත්මක තොරතුරු ලබාදීම.

සාධාරණ අගය මැනීමේදී ප්‍රමාණාත්මක නිරීක්‍ෂණය කළ නොකළ යෙදවුම් අස්තිත්ත්වය සංවර්ධනය කර නොමැත්තේ නම් මෙම හෙළිදරව් කිරීමේ අවශ්‍යතා සමඟ අනුකූලවීමට ප්‍රමාණාත්මක තොරතුරු අස්තිත්ත්වයක් නිර්මාණය කිරීම අවශ්‍ය නොකෙරේ. කෙසේ වෙතත් මෙම හෙළිදරව් කිරීම ලබාදීමේදී, ඒවා සාධාරණ ලෙස අස්තිත්ත්වයට ලබාගත හැකි සහ සාධාරණ අගය මැනීමේදී ඒවා වැදගත්නම් ප්‍රමාණාත්මක නිරීක්‍ෂණය කළ නොහැකි යෙදවුම් අස්තිත්ත්වයකට නොසළකා හැරිය නොහැක.

(ඉ) සාධාරණ අගය පද්ධතියේ 3 න් වන මට්ටම තුළ වර්ගීකරණය කළ පුනරාවර්තනයවන සාධාරණ අගය මැණීම සඳහා, කාලපරිච්ඡේදය තුළ පහත සඳහන් දැට ආරෝපිත වෙනස්වීම් වෙනම හෙළිදරව් කරන ආරම්භක ශේෂයේ සිට අවසාන ශේෂය දක්වා සංසන්දනය කිරීමක්,

(i) කාලපරිච්ඡේදය සඳහා ලාභයේ හෝ අලාභයේ හඳුනාගත් ප්‍රතිලාභ හෝ අලාභවල එකතුව සහ එම ප්‍රතිලාභ හෝ අලාභ හඳුනාගත් ලාභයේ හෝ අලාභයේ පේළි අයිතමය(න්),

(ii) කාලපරිච්ඡේදය සඳහා වෙනත් විස්තීර්ණ ආදායමේ හඳුනාගත් ප්‍රතිලාභ හෝ අලාභවල එකතුව සහ එම ප්‍රතිලාභ හෝ අලාභ හඳුනාගත් වෙනත් විස්තීර්ණ ආදායමේ පේළි අයිතමය(න්),

(iii) මිලදී ගැනීම්, විකුණුම්, නිකුත් කිරීම් සහ නිරවුල් කිරීම (මෙම එක් එක් වර්ගයේ වෙනස්වීම් වෙනම හෙළිදරව් කරමින්), සහ

(iv) සාධාරණ අගය පද්ධතියේ 3 වන මට්ටම තුළට හෝ ඉන් පිටතට කරන ලද යම් මාරු කිරීමකට වටිනාකම, එම මාරු කිරීම්වලට හේතු සහ මට්ටම් අතර මාරු කිරීම් සිදුවූවා යැයි හැඟෙන බව නිර්ණය කිරීමට වන අස්තිත්ත්වයේ ප්‍රතිපත්ති (SLFRS 13 හි 95 ඡේදය බලන්න) 3 වන මට්ටම තුළට කරන ලද මාරු කිරීමේ හෙළිදරව් කරන අතර, 3 වන මට්ටමෙන් පිටතට කරනු ලබන මාරු කිරීම් වෙනම සාකච්ඡා කෙරේ.

(ඊ) සාධාරණ අගය පද්ධතියේ 3 වන මට්ටම තුළ වර්ගීකරණය කර ඇති පුනරාවර්තනයවන සාධාරණ අගය මැනීම සඳහා, වාර්තාකරණ ලද කාලපරිච්ඡේද අවසානයේ රඳවා ඇති එම වත්කම් සහ වගකීම්වලට සම්බන්ධිත උපලබ්ධි නොවූ ප්‍රතිලාභ හෝ අලාභවල වෙනස්වීමට ආරෝපිත ඉහත (ඉ)(i) හි ලාභ හෝ අලාභ වල ඇතුළත් කාලපරිච්ඡේදය සඳහා ප්‍රතිලාභ හෝ අලාභවල එකතුවේ වටිනාකම සහ එම උපලබ්ධි නොවූ එම ප්‍රතිලාභ හෝ අලාභ හඳුනාගත් ලාභ හෝ අලාභවල පේළි අයිතමය(න්)

(උ) සාධාරණ අගය පද්ධතියේ 3 වන මට්ටම තුළ වර්ගිකරණය කළ පුනරාවර්තනය වන සහ පුනරාවර්තනය නොවන සාධාරණ අගය මැනීම සඳහා, අස්තිත්ත්වය විසින් භාවිත කළ අගය කිරීමේ ක්‍රියාවලිත්, ආදායම් මඟ භාවිත කළේ නම්, වාර ගණන (සංඛ්‍යාතය) සහ ක්‍රමාංකනය කළ ක්‍රම, ආපසු පරීක්‍ෂාව සහ මිල කිරීමේ ආකෘතිවල පරීක්‍ෂා කිරීමේ පටිපාටි (IFRS IE 6(b)

<table>
<tr><td></td><td>
(උ) සාධාරණ අගය පද්ධතියේ 3 වන මට්ටම තුළ වර්ගීකරණය කළ සාධාරණ අගය මිනුම්කරණ සඳහා<br><br>
(i) එවැනි සියළු මිනුම්කරණ සඳහා වෙනස් වටිනාකමකට නිරීක්‍ෂණය කළ නොහැකි යෙදවුම්වල වෙනස්වීමකට, සැළකිය යුතු අන්දමේ ඉහළ හෝ පහළ සාධාරණ අගය මැනීමක් ප්‍රතිඵලයක් විය හැකි නම්, නිරීක්‍ෂණය කළ නොහැකි යෙදවුම්වල වෙනස්වීමකට සාධාරණ අගය මැනීමේ සංවේදීතාවයේ සිදුවීම් පෙළේ විස්තරයක් සාධාරණ අගය මිනුම්කරණයේදී එම යෙදවුම් සහ වෙනත් නිරීක්‍ෂණය කළ හැකි යෙදවුම් අතර අන්තර් සම්බන්ධතාවයන් තිබේ නම්, එම අන්තර් සම්බන්ධතාවයන්ගේ විස්තරයක් සහ සාධාරණ අගය මැනීම මත නිරීක්‍ෂණය කළ නොහැකි යෙදවුම්වල වෙනස්වීමේ බලපෑම කෙසේ ඒවා සැහැල්ලු කරන්නේ හෝ විශාල කරන්නේ කෙසේදැයි විස්තරයක් ලබාදීම. එම හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවයක් සමඟ අනුකූලවීමට නිරීක්‍ෂණය කළ නොහැකි යෙදවුම්වලට වෙනස්වීම් වලට සංවේදී වන සිදුවීම් පෙළේ විස්තරයක් අවම වශයෙන් පහත දෑ සමග ඇතුළත් ය. (ඇ) සමග අනුකූලවන විට හෙළිදරව් කළ නිරීක්‍ෂණය නොකළ යෙදවුම් සහ<br><br>
(ii) මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් සඳහා සාධාරණ අන්දමකින් විය හැකි විකල්ප උපකල්පන සාධාරණ අගය වෙනස්වීම සැළකිය යුතු අන්දමකින් වෙනස්වන බවක් පිළිබිඹු වීමට එකක් හෝ ඊට වැඩි නිරීක්‍ෂණය කළ නොහැකි යෙදවුම් වෙනස් කරන්නේ නම්, එම කරුණ සඳහන් කර, එම වෙනස්වීම්වල බලපෑම හෙළිදරව් කිරීම. වෙනස් වීමක බලපෑම පිළිබිඹුවීමට, සාධාරණ ලෙස විය හැකි විකල්ප උපකල්පනය කෙසේ ගණනය කළේ දැයි හෙළිදරව් කිරීම එම අරමුණ සඳහා වැදගත්කම විනිශ්චය කරනුයේ ලාභ හෝ අලාභ සහ වත්කම් හෝ වගකීම් වල එකතුව සම්බන්ධය හෝ සාධාරණ අගයේ වෙනස්වීම වෙනත් විස්තීර්ණ ආදායමේ මුළු ස්කන්ධයේ හඳුනාගන්නා විටඃ සහ<br><br>
(එ) පුනරාවර්තනයවන සහ පුනරාවර්තනය නොවන සාධාරණ අගය මිනුම්කරණය සඳහා, මූල්‍ය නොවන වත්කමක ඉහළම සහ වඩාත් හොඳ භාවිතය එහි ප්‍රවර්තන භාවිතයෙන් වෙනස්වේ නම් එම කරුණ සහ එහි ඉහළම සහ වඩාත් හොඳ සහ ඉහළම භාවිතයෙන් වෙනස්වන ආකාරයෙන් මූල්‍ය නොවන වත්කම් භාවිත කළේකුමක් නිසාද යන්න හෙළිකළ යුතුය.
</td><td></td></tr>
<tr><td>SLFRS 13 94 (අ), (ආ) ඡේද</td><td>
4. පහත සඳහන් පදනම මත වත්කම් සහ වගකීම්වල උචිත පන්තීන් නිර්ණය කිරීම<br><br>
(අ) වත්කමේ ස්වභාවය, ගති ලක්‍ෂණ සහ අවදානම්, සහ<br><br>
(ආ) සාධාරණ අගය වර්ගීකරණය කළ සාධාරණ අගය පද්ධතියේ තුළ මට්ටම<br><br>
• එම සාධාරණ අගය මැනීමට විශාල ප්‍රමාණයක අනියතාවයක් සහ විෂයබද්ධානුභාවයක් ඇති නිසා, සාධාරණ අගය පද්ධතියේ 3 වන මට්ටම තුළවන සාධාරණ අගය මැනීමට පන්ති ගණන විශාල විය හැකිය.<br><br>
• සාධාරණ අගය මැනීම පිළිබඳව හෙළිදරව් කිරීම. ලබාදීම සඳහා උචිත පන්තිවල වත්කම් සහ වගකීම් නිර්ණය කිරීමට විනිශ්චය අවශ්‍ය කෙරේ. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඉදිරිපත්කළ පේළි අයිතම් වලට වඩා විශාල කොටස්වලට විසුරුවා හැරීමක් පන්තියක වත්කම් සහ වගකීම් වලට බොහෝ විට අවශ්‍ය කෙරේ.<br><br>
• මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඉදිරිපත් කළ පේළි අයිතම සැසඳුම් කිරීමට ඉඩදෙන ප්‍රමාණවත් තොරතුරු ලබාදීම. වෙනත් SLFRS මගින් වත්කමක පන්තිය නියම කරන්නේ නම්, එම පන්තිය SLFRS 13 හි 94 ඡේදයේ අවශ්‍යතාවයන් සපුරාලන්නේ නම්, SLFRS 13 න් අවශ්‍ය කරන හෙළිදරව් කිරීම ලබාදීමේදී අස්තිත්ත්වය භාවිත කළ හැකිය.
</td><td></td></tr>
</table>

| | | | |
|---|---|---|---|
| SLFRS 13, 95 (අ) - (ඇ) ඡේද | 5. | SLFRS 13 හි 93 (ඇ) සහ ඇ (iv) ඡේද ප්‍රකාරව සාධාරණ අගය පද්ධතියේ මට්ටම් අතර හුවමාරු සිදුවූවා යැයි සැළකෙන අවස්ථාව නිර්ණය කිරීම සඳහා අස්තිත්ත්වය ප්‍රතිපත්තිය අඛණ්ඩව අනුගමනය කිරීම සහ හෙළිදරව් කිරීම. හුවමාරු කිරීම් හඳුනා ගැනීමේ කාල සැකසුම පිළිබඳ ප්‍රතිපත්තිය මට්ටම් තුළට මාරු කිරීම් මෙන්ම මට්ටම්වලින් මාරු කිරීම්ද එක හා සමානවේ. හුවමාරු කිරීමේ කාල සැකසුම නීර්ණය කිරීම සඳහා ප්‍රතිපත්ති වලට උදාහරණ වලට පහත දෑ ඇතුළත් වේ.<br><br>(අ) හුවමාරුවට හේතුකාරක වූ සිද්ධියේ දිනය හෝ තත්ත්වයේ වෙනස්වීම්,<br><br>(ආ) වාර්තා කරනු ලබන කාලපරිච්ඡේදයේ ආරම්භය, සහ<br><br>(ඇ) වාර්තා කරනු ලබන කාලපරිච්ඡේදයේ අවසානය | |
| SLFRS 13, 97 ඡේදය | 6. | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, සාධාරණ අගයට මනින නොලැබූ, එහෙත් ඒවා සඳහා සාධාරණ අගය හෙළිදරව් කළ සියළුම වත්කම් සඳහා SLFRS 13 හි 93 (ආ) - ඈ) සහ (i) ඡේදයන් ගෙන් අවශ්‍ය කරන තොරතුරු හෙළිදරව් කිරීම කෙසේ වෙතත් SLFRS 13 හි 93 (ඇ) ඡේද මගින් අවශ්‍ය කරන පරිදි සාධාරණ අගය පද්ධතියේ 3 න් වන මට්ටම තුළ වර්ගීකරණය තුළ සාධාරණ අගය මැනීමේදී භාවිත කළ වැදගත් නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් පිළිබඳ ප්‍රමාණාත්මක හෙළිදරව් කිරීමක් අස්තිත්ත්වයක් ලබාදීම අවශ්‍ය නොකෙරේ. එවැනි වත්කම් සහ වගකීම් සඳහා මෙම SLFRS මගින් අවශ්‍යකරන වෙනත් හෙළිදරව් කිරීම් අස්තිත්ත්වයක් ලබාදීම අවශ්‍ය නොවේ. | |
| SLFRS 13, 99 ඡේදය | 7. | වෙනත් ආකෘතියක් වඩාත් උචිත වන්නේ නම් හැර මෙම SLFRS මගින් අවශ්‍ය කරන ප්‍රමාණාත්මක හෙළිදරව් කිරීම තීරු සහිත ආකෘතියකට ඉදිරිපත් කිරීම. | |

**සටහන**

එහි මූල්‍ය ප්‍රකාශන පරිශීලකයනට උපකාරීවන අමතර තොරතුරු එලෙස හෙළිදරව් කිරීම අවශ්‍ය වේ.

ඉහත වගුවේ වම් පැත්තට වන පළමු තීරුවේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත SLFRS 13 හි ඡේදයට වන යොමුව සඳහන් වේ. උදාහරණයක් වශයෙන් "SLFRS 13 හි 40 ඡේදය" SLFRS 13 සහ 40 ඡේදය ඇඟවේ.

උචිතවන පරිදි එක්කෝ Y - ඔව්, N - නැත හෝ N/A අදාළ නොවේ යැයි සෑම එය හෙළිදරව් කිරීමේ අයිතමයකම ඇතුළත් කිරීමට පිළියෙල කරන්නන් දිරිමත් කෙරේ.

## 3 වන ඇමුණුම - නිශ්චිත අයිතම සඳහා SLFRS13 හි ප්‍රායෝගික ව්‍යවහාරකරණය

| | දේපිඋ | ආයෝජන දේපළ | ජීව විද්‍යාත්මක වත්කම් |
|---|---|---|---|
| අදාළත්වය | ප්‍රත්‍යගණන ආකෘතිය අනුව පසුව මනින ලද දේ.පි.උ. අයිතම සඳහා | මෙය මනිනු ලබන්නේ සාධාරණ අගය ආකෘතිය හෝ පිරිවැය ආකෘතිය ප්‍රකාරවද යන්න නොසළකා (සාධාරණ අගය හෙළිදරව් කිරීම අවශ්‍ය කරන නිසා) | මූලික හඳුනා ගැනීම පැත්තෙන් ගත් කළ සාධාරණ අගයේ විකුණුමට වන පිරිවැය අඩුකර මැනීමට |
| ගිණුම් ඒකකය | සාමාන්‍යයෙන්, වෙන්ව හඳුනාගත හැකි සහ තනි තනිව වැදගත් අයිතමයන් ගිණුම් ඒකකයන් ස්ථාපිත වේ. සංරචක දෙකම වෙනම වූ ගිණුම් ඒකක වූයේ වුවද සමස්ථයක් වශයෙන් වත්කම් සමූහයකට පමණක් වෙළඳපොළක් පවතින විට ඉඩම් හා ගොඩනැගිලි සමූහයේ සාධාරණ අගය සමස්ථයක් වශයෙන් මැන අනතුරුව අගය එක් එක් සංරචකයට වෙන් කිරීම. | උදා: ගිණුම් ඒකකයක් ඉඩමක්, ගොඩනැගිල්ල හෝ ගොඩ-නැගිල්ලක කොටසක් හෝ දෙකම සහ බඩුමුට්ටු සහිත කල් බද්දක්, එමෙන්ම සම්බන්ධිත චංචල ගෘහ භාණ්ඩ වුවද | එක්කෝ තනි වත්කමක් හෝ වත්කම් සමූහයක් විය හැකිය.උදා: වනයක ඇති ගස් ඒවායේ වැදගත් ගුණාංග ප්‍රකාරව, වත්කම් කාණ්ඩගත කිරීමට LKAS 41 ඉඩ දේ.<br>• උදා: පශු සම්පත් ඒවායේ වයස සහ බර ප්‍රකාරව<br>• අස්වැන්න තත්ත්වය ප්‍රකාරව<br><br>අස්වැන්න ලැබෙන තුරු ජීව විද්‍යාත්මක වත්කම් වලට ඇඳුන අනාගත කෘෂිකාර්මික නිෂ්පාදන වෙනම හඳුනාගනු නොලබන අතර සහ සාධාරණ අගය නිර්ණය කරනුයේ වත්කම සමස්ථයක් පදනම මතය. ජීව විද්‍යාත්මක වත්කම්, ඉඩම් සහ ඉඩම්වලට වැඩි දියුණු කිරීම් සංයෝජන පැකේජයකට පමණක් සක්‍රීය වෙළඳපොළක් පවතින විට, ජීව විද්‍යාත්මක වත්කම්වල සාධාරණ අගය ලබා ගැනීම හැකිවනු වස් සංයෝජිත පැකේජයෙන් ඉඩම් සහ ඉඩම් වැඩි දියුණු කිරීම්වල පිරිවැය අඩු කිරීමට සිදුවිය හැකිය. |
| තක්සේරු කිරීමේ ප්‍රවේශය සහ ශිල්ප ක්‍රම | • නියම වශයෙන් වෙළඳපොළ ප්‍රවේශයට මගින්<br>• මෑතකදී මිලදී ගත්තේ නම් පිරිවැය ප්‍රවේශය<br>• විශේෂීකරණය වූ පිරියත සඳහා පිරිවැය ප්‍රවේශය | නියම වශයෙන් වෙළඳපොළ ප්‍රවේශය මගින් (උදා: නිෂ්පාදනය මෙට්‍රික් වලින්, මිල වර්ග අඩියකට/ මීටරයකට ආයෝජන දේපළ වර්ග ප්‍රමාණයට) ආදායම් ප්‍රවේශ (උදා: ඵලදාක්‍රමය, දේපළවල ප්‍රවර්තන හෝ වාහන කුලී වටිනාකම/ දේපොල වල අගය සහ වට්ටම්කල මුදල් ප්‍රවාහ ශිල්ප ක්‍රමය.දේපොළෙන් | වෙළඳපොළ ප්‍රවේශය භාවිත කරමින් ජීව සතුන්,භෝග මූලික වැඩෙන අවස්ථාවේදී පිරිවැය ප්‍රවේශය. ඊට පසුව ආදායම් ප්‍රවේශය (අගය කිරීමේ ශිල්ප ක්‍රමය ක්‍රමාංකනය කළ යුතු වේ) |

| | | | |
|---|---|---|---|
| | | පැන නගින අපේක්ෂිත මුදල් ගලාඒම් සහ ගලා යාම් ආයෝජනයට අවශ්‍ය කරන ප්‍රතිලාභ අනුපාතිකයෙන් වට්ටම් කිරීමෙන් ප්‍රතිඵලය නිරීක්ෂණය කළ හැකි වෙළඳපොළ දත්ත පිළිබිඹුවීමට තක්සේරු ශිල්ප ක්‍රමය ක්‍රමාංකනය කළ යුතුවේ. පිරිවැය ප්‍රවේශයට (ඉදිකිරීම් පිරිවැය, මූල්‍යකරණ පිරිවැය සහ සාධාරණ ලාභ ආන්තිකය) ඉදිකරමින් පවතින ආයෝජන දේපළවල සාධාරණ අගය පිරිවැය ප්‍රවේශය භාවිත කර මැනිය හැකිය. | |

01 වන සටහන

ජීව විද්‍යාත්මක වත්කමක සධාරණ අගය වත්කමේ ප්‍රවර්තන අස්වැන්නේ වටිනාකම පමණක් නොව අනාගතයේදී සිදුවිය හැකි වෙළඳපොළ සහභාගීවන්නෙක් තක්සේරු කිරීමේ සැළකිල්ලට ගත හැකි අතිරේක ජීව විද්‍යාත්මක පරිවර්තනයන්ද ඇතුළත් වේ. එබැවින් වත්කමට ඇඳුන ඇස්තමේන්තු කළ ඵලදාව වැනි අවදානම් (උදා: කාලගුණය) සහ අපේක්ෂාකරණ තත්ත්වයට වත්කම ගෙනඒමට වන ඇස්තමේන්තුගත පිරිවැයද සැළකිල්ලට ගත යුතුය. මෙම අවදානම් අනාගත මුදල් ප්‍රවාහවලට සම්බන්ධිත අනියතාවය ආමන්ත්‍රණය කරන අතර සහ ඒවා එක්කෝ වට්ටම් අනුපාතියේ සහ හෝ ඇස්තමේන්තු කළ අපේක්ෂිත මුදල් ප්‍රවාහවල පිළිබිඹු වේ.

වට්ටම්කළ මුදල් ප්‍රවාහ අගය කිරීමේ ක්‍රමයේදී, වත්කමෙන් වන අපේක්ෂිත ශුද්ධ මුදල් ප්‍රවාහවල වර්තමාන අගය වට්ටම් කරනුයේ වත්කම එහි ප්‍රවර්තන පිහිටීම සහ තත්ත්වයත් සාධාරණ අගය නිර්ණය කිරීමට භාවිත කළ ප්‍රවර්තන වෙළඳපොළ උචිත වට්ටම් අනුපාතිකයක් නිර්ණය කිරීමට අවශ්‍යවේ. මූලික පිරිවැය දැරීමෙන් පසු සුළු ජීව විද්‍යාත්මක පරිවර්තනයක් සිදුවී ඇතිවිටක පිරිවැය සාධාරණ අගයට ආසන්නවේ (LKAS 24 හි, 24 වන ඡේදය) මෙවැනි තත්ත්වයන්හිදී තෝරාගත් වට්ටම් අනුපාතිකය, එම පිරිවැයට ආසන්න වන වටිනාකමට ප්‍රතිඵලයක් වීම අපේක්ෂාකරන බව අන්තර්ජාතික මූල්‍ය වර්තාකරණ අර්ථ නිරූපනය කිරීමේ කමිටුව (IFRIC) සටහන් කරගනී.

එම වත්කම සඳහා (වෙනස් කිරීමක් හෝ යළි ඇසිරීම නොකර) වෙනත් නිරීක්ෂණය කළ හැකි වෙළඳපොළ ගණුදෙනු සමඟ සංසන්දනය කිරීම මගින් වත්කමේ සාධාරණ අගය සාක්ෂිදරන්නේ හෝ වෙළඳපොළ නිරීක්ෂණය කළ හැකි දත්ත වලින් ඒවායේ විචල්‍යන් ඇතුළත් තක්සේරු ශිල්ප ක්‍රමයේ මත පදනම් වූ අගය කිරීමක් නම් හැර මූලික හඳුනා ගැනීමේදී වත්කමක සාධාරණ අගයේ හොඳම සාක්ෂිය වන්නේ එහි ගණුදෙනු වූ මිලයි. ඉහත සඳහන් කළ අවශ්‍යතාවය ව්‍යවහාර කිරීමෙන් වත්කමක මූලික හඳුනා ගැනීමේද ප්‍රතිලාභයක් හෝ අලාභයක් හඳුනාගැනේ. එවැනි අවස්ථාවකදී මූලික හඳුනා ගැනීමෙන් පසු ප්‍රතිලාභයක් හෝ අලාභයක් හඳුනා ගත යුත්තේ, මිල නියම කිරීමේදී වෙළඳපොළ සහභාගීවන්නන් සැළකිල්ලට ගන්නා සාධකයක (කාලය ඇතුළුව) වෙනස්වීමෙන් පැන නගින ප්‍රමාණය පමණි. අස්තිත්ත්වයක් විටින් විට තක්සේරු කිරීමේ ශිල්ප ක්‍රමය ක්‍රමාංකනය කරන අතර එම වත්කම සඳහාම නිරීක්ෂණය කළහැකි ප්‍රවර්තන වෙළඳපොළ ගණුදෙනු වලින් වන මිල ගණන් භාවිත කර එහි වලංගුතාවය පිළිබඳ පරීක්ෂා කරයි. වත්කම උත්පාදනය තුළ එම වෙළඳපොළම අස්තිත්ත්වය වෙළඳපොළ දත්ත ලබා ගනී.

වත්කමේ එහි ප්‍රවර්තන ස්වරූපය සඳහා සක්‍රීය වෙළඳපොළක් නොපවතින විටදී, සාධාරණ අගය මැනීමේ යෙදවුමක් ලෙස ඒ හා සමාන වත්කම් සඳහා නිරීක්ෂණය කළ හැකි මිල ගණන් අස්තිත්ත්වයන් භාවිත කළ හැකිය. එවිට සාධාරණ අගයට මනිනු ලබන වත්කම සහ වෙළඳපොළ මිල ගණන් ලබා ගත හැකි ඒ හා සමාන වත්කම අතර යම් වෙනස්කම් සඳහා උචිත ගැළපුම් කිරීම අවශ්‍ය වේ.

පිරියතක සම්පූර්ණ ජීව කාලයටම ප්‍රවර්තනය පිරිවැයට සහ මිල ගණන්වල ප්‍රායෝගික මුදල් ප්‍රවාහයක් සහන මිල ගණන් මිල පිළියෙල කරයි. IFRIC න්‍යාය පත්‍රය තීරණය පදනම මත වට්ටම් අනුපාතිකය නිර්ණය කරනුයේ, වගා කරනු ලබන අවස්ථාවේ මූලික පිරිවැය ශුද්ධ වර්තමාන අගයට ආසන්න වන ලෙසය. මෙය ක්‍රමාංකනය කිරීමේ අවශ්‍යතාවය සපුරාලන අතර 'පළමු දිනයේ ලාභය' වළක්වාලයි. පසුව එන වර්ෂවල නව ප්‍රවර්තන පිරිවැය සහ මිල ගණන් පදනම මත ප්‍රත්‍යාණනය කිරීමක් කරනු ලැබේ. කාලයේ විවිධ අවස්ථාවල සාධාරණ අගය ගණනය කරන අතර එය එම අවස්ථාවේ පවතින මිල ගණන් පිළිබිඹු වනු ඇත.

## 4 වන ඇමුණුම නිර්වචිත පද

| | |
|---|---|
| සක්‍රීය වෙළඳපොළ | වත්කම් සහ වගකීම් සඳහා සැහෙන තරම් සංඛ්‍යාතයකින් සහ පරිමාවකින් දිගට පවත්නා පදනමින් මිල ගණන් තොරතුරු ලබාදෙන ගණුදෙනු සිදුවන වෙළඳපොළකි. |
| ජීව විද්‍යාත්මක වත්කම් | ජීවත්වන සත්වයෙකු හෝ පැලෑටියකි. |
| බැහැර කිරීම සඳහා වන පිරිවැය | වත්කමක් බැහැර කිරීම සඳහා හෝ මුදල් උත්පාදනය ඒකකයක් බැහැර කිරීම හා මූල්‍ය පිරිවැය සහ ආදායම් බදු හැර සෘජුව ආරෝපිත වන වර්ධක පිරිවැය. |
| විකිණීමට සඳහා වන පිරිවැය | වත්කමක් ඉවත් කිරීම හා පිළිබඳව මූල්‍ය පිරිවැය සහ ආදායම් බදු හැර සෘජුව ආරෝපිතවන වර්ධක පිරිවැයයි. |
| ඇතුළත් වීමේ මිල | හුවමාරු ගණුදෙනුවකදී වත්කමක් අත්කර ගැනීමට ගෙවූ හෝ වගකීමක් භාර ගැනීමට ලැබූ මිලයි. |
| පිටවීමේ මිල | වත්කමක් විකිණීමකට ලැබිය යුතු සහ වගකීමක් පැවරීමට ගෙවූ මිල ය. |
| ඉහළම සහ වඩාත් හොඳ භාවිතය | වත්කම භාවිත කරනු ලබන දයක් තුළ වත්කමේ හෝ වත්කම් සමූහයේ සහ වගකීම්වල (උදා: ව්‍යාපාරයක්) වටිනාකම උපරිම වන ලෙස වෙළඳපොළ සහභාගීවන්නන් මූල්‍ය නොවන වත්කමක් භාවිත කිරීමයි. |
| වඩාත් වාසිදායක වෙළඳපොළ | වත්කමක් සඳහා වඩාත් වාසිදායක වෙළඳපොළ වනුයේ ගණුදෙනු පිරිවැය සහ ප්‍රවාහන පිරිවැය ගණන් ගැනීමෙන් අනතුරුව වත්කමක් විකිණීමකදී ලැබිය හැකි වටිනාකම උපරිම වන වෙළඳපොළයි. |
| නිරීක්ෂණය කළ හැකි යෙදවුම් | සත්‍ය සිදුවීම් හෝ ගණුදෙනු පිළිබඳව පොදුවේ ලබාගත හැකි වත්කම හෝ වගකීම මිලකිරීමේදී වෙළඳපොළ සහභාගිවන්නන් භාවිත කළ හැකි උපකල්පන පිළිබිඹුවන පොදුවේ ලබාගත හැකි තොරතුරු වැනි වෙළඳපොළ දත්ත භාවිත කර සංවර්ධනය කරන යෙදවුම් වේ. |
| ප්‍රධාන වෙළඳපොළ | වත්කම සඳහා විශාලතම පරිමාව සහ ක්‍රියා මට්ටම් ඇති වෙළඳපොළ ප්‍රධාන වෙළඳපොළයි. |
| *පොදු ගිණුම් කටයුතු භාවිතය* | පහත දෑ සිදුවන්නේ නම් අස්තිත්ත්වයකට පොදු ගිණුම් කටයුතු භාවයක් ඇත.<br><br>(අ) එහි ණය හෝ ස්කන්ධ සාධන පත්‍ර පොදු වෙළඳපොළක වෙළඳාම් වන්නේද හෝ පොදු වෙළඳපොළක වෙළඳාම් කිරීම සඳහා එවැනි සාධන පත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලියක නියැලී සිටින්නේද (දේශීය හෝ විදේශීය කොටස් හුවමාරුවක හෝ දේශීයසහ ප්‍රාදේශීය වෙළඳපොළවල් ඇතුළුව) අත්පිට විකුණුම් වෙළඳපොළක්<br><br>(ආ) එහි ප්‍රාථමික ව්‍යාපාර වලින් එකක් වශයෙන් බාහිර (පිටස්තර) පුළුල් සමූහයක් සඳහා පීත කොමිස් භාරකරුවෙකුගේ නීතිමය හැකියාවෙන් වත්කම් රඳවා තබාගැනීම මේ සඳහා නියම වශයෙන් වන උදාහරණ වන්නේ බැංකු, ණය සංගම, රක්ෂණ සමාගම්, සුරැකුම්පත්, තැරැව්කරුවන්/ වෙළෙන්ඳන් අන්‍යෝන්‍ය අරමුදල් සහ ආයෝජන බැංකුවේ.<br><br>මෙම අරමුණ සඳහා පොදු ගිණුම් කටයුතුභාවය ඇති ලෙස සැළකිය හැකි අස්තිත්ත්වවලට උදාහරණ පහත වේ.:-<br>- 1988 අංක 30 දරන බැංකු පනත යටතේ අවසරලත් සමාගම්<br>- 1962 අංක 25 දරන රක්ෂන පාලන පනත යටතේ රක්ෂණ ව්‍යාපාර<br>- කල් බදු ව්‍යාපාර පවත්වාගෙන යන සමාගම්<br>- ණය එකතු කිරීමේ සමාගම්<br>- 1988 අංක 78 දරන මූල්‍ය සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති සමාගම් |

| | |
|---|---|
| | - 1987 අංක 36 දරන සුරැකුම්පත් සහ විනිමය කොමිසම් පනත යටතේ ඒකක භාර මෙහෙයවීම අවසරලත් සමාගම්.<br>- අරමුදල් කළමනාකරණ සංගම්<br>- 1987 අංක 36 දරන සුරැකුම්පත් සහ විනිමය කොමිසම් පනත යටතේ කොටස් තැරැව්කරුවන් හෝ කොටස් වෙළඳුන් ලෙස ව්‍යාපාර පවත්වාගෙන යෑමට අවසර ලත් සමාගම්<br>- 1987 අංක 36 දරන සුරැකුම්පත් සහ විනිමය කොමිසම් පනත යටතේ කොටස් හුවමාරුවක් පවත්වාගෙන යාමට අවසර ලත් සමාගම්.<br>- 1987 අංක 36 දරුන සුරැකුම්පත් සහ විනිමය කොමිසම් පනත යටතේ අවසරලත් කොටස් හුවමාරුවක ලැයිස්තුගත සමාගම්<br>- භාණ්ඩ විකිණීම සහ සේවා සැපයීමේ නියැලී සිටින පොදු සංස්ථා |
| ආපසු අයකර ගැනීමට හැකි වටිනාකම | වත්කමක හෝ මුදල් උත්පාදන ඒකකයක ආපසු අයකර ගතහැකි වටිනාකම වනුයේ සාධාරණ අගයෙන් බැහැර කිරීම් පිරිවැය අඩුකළ පසු වටිනාකම් සහ එහි ප්‍රයෝජ්‍ය අගය යන අගයන්ගෙන් වැඩි අගය වේ. |
| නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් | යෙදවුම් සඳහා වෙළඳපොළ දත්ත ලබාගත නොහැකි සහ වත්කම් සහ වගකීම් මිල කිරීමේදී වෙළඳපොළ සහභාගීවන්නන් භාවිතකරන උපකල්පන පිළිබඳව ලබාගත හැකි හොඳම තොරතුරු භාවිත කර සංවර්ධනකරණ යෙදවුම් |

12-414

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.